

# අමරණීයයකුගේ මරණය

## සහ තවත් කෙටි කතා

නතාලි දමිසිනි විතානාච්චි

# අමරණීයයකුගේ මරණය සහ තවත් කෙටි කතා

## නතාරි දම්සිනි විතානාච්චි

අමරණීයයකුගේ මරණය සහ තවත් කෙටිකතා

කතාව, පිටකවරය සහ පරිගණක අක්ෂර
නතාරි දම්සිනි විතානාච්චි

නො. 27/A, ධර්මාශෝක මාවත, මහනුවර

ISBN:
978-624-206-651-6

එළිදැක්වූ වර්ෂය:
2023

කතෘගේ වෙනත් පොත්,

තෑග්ග
අනූගේ චාරිකාව
අනාගතයට ගමනක්
තණ්හාවෝ
The Gift (පරිවර්තන)
බාර්බි සහ අධිරාජ්‍යයාගේ තේ බඳුනේ අභිරහස (පරිවර්තන)

***...පිදුම...***

ලෝකයේ

ඇති විස්මිත දෑ සොයායන

අද්භූත අත්දැකීම් විඳීමට කැමති

සුවහසක්

ප්‍රබන්ධ පාඨකයින් වෙත

පුදමි.

## ...පෙරවදන...

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමින් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුලින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුල ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි

ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදී ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විදුහල, මහනුවර

2023.10.20

## ...ස්තූතිය...

මේ පොත එළිදැක්වීමට මා හට සහය දැක්වූවෝ බොහෝය. පොතක් ලිවීමට මා සිතේ ආශාවක්, උනන්දුවක් සහ ධෛර්යයක් ඇති කළ එම්. එම්. සෙනෙවිරත්න ගුරු පියාණන්ට ප්‍රථමයෙන් මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි.

ව්‍යාකරණ හැසිරවීම, වාක්‍ය ගැලපීම ආදියේ සිට පොත එළිදැක්වීම දක්වා මහත් කැපවීමකින් කටයුතු කළ මාගේ ආදරණීය අම්මා සහ අප්පච්චී ඇතුළු මගේ පවුලේ සැමටත්, මා හට සිප්සතර දුන් සියලුම ගුරු මෑණිවරුන්ටත්, ගුරු පියවරුන්ටත්, නිරන්තරයෙන්ම මා දිරිගැන්වූ මගේ මිතුරියන්ටත්, මා පසුපස සිටිමින් නිරතුරුව මා හට ශක්තියක් වූ සියලු දෙනාටත් මම මගේ හදපිරි ස්තූතිය පිරිනමමි.

## *කතුවරියගෙන් වදනක්*

නෙකවිධ මාතෘකා අලලා ලියැවුණු ප්‍රබන්ධ දහස් ගණනින් ඇත. එක් අයෙකුගේ සිතෙහි මැවෙන, සත්‍ය වශයෙන් විද්‍යමාන නොවන යමක් කතාන්දරයක් ලෙස සහෘද පාඨකයින් වෙත ඉදිරිපත් කිරීමක් ලෙස එය දැක්විය හැකිය. ඉන් සමහර ප්‍රබන්ධයන් කාලයා විසින් සිදුවිය නොහැකි බවට ප්‍රත්‍යක්ෂ කර ඇත. ඇතැම් ප්‍රබන්ධ දශක, සියවස් ගණනාවක් මුළුල්ලේ ප්‍රශ්ණාර්ථයක්ව ඉතිරිව පවතිද්දී ඇතැම් ඒවා විද්‍යාව හමුවේ සත්‍යයන් බවට පත්වේ. කලෙක සිදුවිය නොහැකියැයි පිළිගැණුනු ඇතැම් ප්‍රබන්ධයන් තවත් කලෙක සත්‍යයන් බවට පත්වේ.

එසේ බැලූ කල මෙලොව සිදුවිය නොහැකි යමක් නැත. අප කිසිවකුත් නොදැන ඒවා සිදුවෙමින් පවතිනවා විය හැකියි. මෙලොව ඒතරමටම පුදුමාකාරය. මෙම පොතෙන් ඔබට අක්ෂරයන් ලෙස හමුවන දෑ දිනෙක සත්‍ය වශයෙන් අත්විදීමට සිදුවිය හැක.

නතාරි දම්සිනි විතානාච්චි
මහ/මහාමායා බාලිකා විදුහල

# පටුන

1.අදිසි කැඳවීම

2. දුරකථන ඇමතුම

3. යථාර්තය

4. අමරණීයයකුගේ මරණය

# අදිසි කැඳවීම

සතියේ මැද වෙහෙසකර දිනයක් නිමා කර මම රාත්‍රි දහය පමණ වනවිට නිදන්නට ගියෙමි. සිතේ ඇති කරදරකාරී බව, විඩාබර ගතිය දුරුකිරීමට මගේ සුවපහසු යහනයට හැකිබව මම දනිමි. පාසලෙන් පසුව ක්‍රීඩා පුහුණුවීම් වලටද සම්බන්ධ වී නිවසට පැමිණ,පාසලෙන් දුන් පැවරුම් ද කිරීමෙන් ඇතිවූ තෙහෙට්ටුව නිසාම යහනයේ වැතිරුණු සැනින් මා කරා නින්ද ඇදී ආවේය. දෑස් වසා ගැනීමෙන් පැතිර යන කළුවරත් සමගම මම කලෙක සිට සැමදා දකින සුපුරුදු සිහිනය මගේ දෑස් මත දිගහැරුණි.

එය අඳුරු ලා නිල් පැහැයක් ඇති විසල් කුටීරයකි. සතර දිශාවෙන්ම එක හා සමාන අඳුරු පැහැ සුමට බිත්ති සතරකි. එහි කිසිදු ජනේලයක්, දොරක් නැත. කුටිය මැද සාමකාමීව ලෙලෙන සුදු පැහැ ගිණිදළුවකි. ඉන් දුමක් හෝ නොනැගේ. කුටියේ වෙනත් කිසිවක් නොමැත. මෙය කියවන ඔබට එය පාළු මූසල පෙනුමක් ඇති කුටියකැ'යි හැගෙනු ඇති මුත් එම සිහිනය දැකීමම මගේ සිතට විශාල සහනයක් ගෙන දේ. ඊට හේතුවත්, වසර ගණනක සිට එකම සිහිනය එකදිගටම දිස්වීමට හේතුවත් නොදන්නවා වුවත් මම ඒ සිහිනයට මහත් සේ ඇළුම් කළෙමි.

නමුත් වෙනදා මෙන් නොව එදා එම සිහිනයේ යම් අමුත්තක් ඇති බව මට දැණුනි.

කුටියේ කවුරුන් හෝ සිටී! නැත... එතැන කිසිවෙක් පෙනෙන්නට නොසිටී. නමුත්, කවුරුන් හෝ එතැන සිටින බව මට දිගින් දිගටම දැණුනි. එය ප්‍රත්‍යක්ෂ කරමින් ටික වේලාවකින් දෝංකාර නංවන තියුණු කටහඩවල් වලින් කෙරෙන සංවාදයක් මට ඇසෙන්නට විය.

"උතුමාණනි..." මගේ වම් පසින් ඇසුණි. නමුත් එම හඬෙහි හිමිකරුවා මට නොපෙනේ.

"වර්තමාන පෘථිවිවාසී මනුෂ්‍යයින් අපි අපේක්ෂා කළ තරමට දියුණු නැහැ." ඔහුගේ කටහඬ මා අසලින්ම ඇසෙන විට මා ද එම කුටිය තුල සිටින බවක් මට හැගෙන්නට විය.

"අපි ඔවුන්ට පමණටත් වඩා කල් දුන්නා." කුටිය මැද වූ සුදු ගිනිදළුවට පිටුපසින් හඬක් පිලිතුරු දුන්නේය.

"නමුත්, අපිට ඔවුන් සමග සම්බන්ධ වෙන්න පුලුවන් තරමේ දියුණුවක්වත් තවම ඔවුන් ලග නැහැ." මගේ වම්පසින් සිටින්නා පැවසුවේය.
"ඔබ පැමිණෙන විට පෘථිවියේ ගතවූයේ මොන වර්ෂයද?" ගිනිදළුවට පිටුපසින් නැගෙන හඬ ඇසුවේය.

"2023, උතුමාණනි."

කලින් පෘථිවියේ සිටි ශිෂ්ඨාචාර සියල්ලම ශතවර්ෂ කිහිපයකින් අපිව සම්බන්ධ කරගත්තා. ඇයි මොවුන්ට තවමත් එය කළ නොහැක්කේ?"

"මොවුන්ගේ මානසික ශක්තිය අතිශයින්ම දුර්වලයි, උතුමාණනි. අපේ නියෝජිතයන් මේ තරම් විශාල ප්‍රමාණයක් ඔවුන් අතරම සිටියත්, ඒ බව ඔවුන් කිසිවෙක් තවම දන්නේ නැහැ."

"එය සිදුවිය නොහැකියි! මෙතන මොකක් හෝ විශාල වැරදීමක් තියෙනවා. එහෙම නේද?"

"සමහරවිට, අපි ඔවුන්ට තව කල් දී බලා සිටීම සුදුසු වෙයි."

"නැහැ." ගිනිදළුව පිටුපසින් නැගෙන හඩ කෝපාවිෂ්ඨව පැවසුවේය. ඒත් සමගම මෙතෙක් වේලා සෙමෙන් ලෙළදුන් ගිනිදළුව ප්‍රචණ්ඩව සැලෙන්නට විය. "තවත් කල් දිය යුතු නැහැ. දැන්මම මේ අසාර්ථක මානව ශිෂ්ඨාචාරය විනාශ කරලා දැමීම සුදුසුයි."

"නමුත්, අවම වශයෙන් ඔවුන් අප හා සම්බන්ධ වන තෙක් හෝ අප බලා සිටිය යුතුයි නේද උතුමාණනි?"

"ඔහ්! එය තීරණය කළ යුත්තේ ඔබ නොවේ, මම!" ගිනිදළුව කුණාටුවකට හසු වූ කලෙක මෙන් ඉහලට ඇදෙන අතරේ ඊට පිටුපසින් නැගෙන හඩ රෞද්‍ර ලෙස ගොරවන්නට විය.

" එය සත්‍යයක්. නමුත් උතුමාණනි, ඔබගේ ක්ෂණික කෝපය වරක් අමරණීයත්වය ලබාගැනීමට ආසන්නව සිටි ඇට්ලන්ටිස් ශිෂ්ඨාචාරය ඔබට අහිමි කළා. තවත් වරෙක පෘථිවියේ අතිශයින්ම දියුණු ඊජිප්තු ශිෂ්ඨාචාරයත්, අරච්ඩා ග්‍රහලොව දියුණුතම නේසන්රිග් ශිෂ්ඨාචාරයත් අහිමි කළා. ඒ නිසා මේ ගැන තවත් සලකා බලන්න."

"පෘථිවියේ මිනිස් ශිෂ්ඨාචාරය වෙනස් කර දියුණු ශිෂ්ඨාචාරයක් කරන එක මගේ අභිප්‍රාය. ඒ සඳහා මම ගත් පියවර සියල්ල අසාර්ථක වුණා. මොවුන්ගේ යම් අසාමාන්‍යතාවයක් තියෙනවා."

"නමුත් උතුමාණනි, අපිට තව ශතවර්ෂ කිහිපයක් යන තෙක් එකම බලාපොරොත්තුව කරගත හැකිවන්නේ පෘථිවිවාසීන් විතරයි නේද? අපි නිවර්චි හි ජීවීන් රෝපණය කරලා තවම සියවස් පනහක්වත් ගතවුණේ නැහැ."

"මවැන්නන් වීමට පෘථිවිවාසී මනුෂ්‍යයින්ට කිසිම සුදුසුකමක් නැහැ. ඒත්, තව සියවසක කාලයක් ඔවුන්ට මම ලබාදෙනවා." ප්‍රචණ්ඩව තිබුණු සුදු ගිනිදළුව ක්‍රමයෙන් සංසුන් විය.

"මානව ශිෂ්ඨාචාරය අපිත් සමග සම්බන්ධ කළ හැකි අයෙක් මම තෝරාගත්තා කලෙකට කලින්. ඇය එක්දහස් එකසිය එකලොස් වෙනි භවයේ සිටින මිනිස් දියණියක්. ඇය දැනටමත් මෙතනට පැමිණ සිටිනවා."

"මිනිස් දියණියක්? ඔහ්! ඒ ඇයද?" මට නොපෙනෙන මා පසෙක සිටින්නා මදෙස සුපරික්ෂාකාරීව බලා සිටින බවක් මට හැඟුණි.

"ඇයව අපගේ අරමුණට ගෙන යා යුතු ආකාරය ඔබ දැනටමත් දන්නවා නේද?"

"එහෙමයි, උතුමාණනි."

"මේඝණා, ඔබට විශාල අරමුණක් දී තිබෙනවා. එය සාර්ථකව නිමකිරීම ඔබගේ යුතුකමක්" ගිනිදළුව පිටුපසින් නැගෙන හිමිකරුවකු නොමැති ඒ අදිසි හඬ මා ඇමතුවේය. ඔහු මාගේ නම දන්නේ කෙසේදැයි මම සිතීමි.

"මම ඔබේ නම දැනගත් ආකාරය වැදගත් නැහැ." මා සිතූ දෙය ඔහුට ඇසුණේදැයි මට සිතාගත නොහැකි විය.

"ඔව්, මට ඔබ සිතන දේ ඇසෙනවා." ඔහු ඊටද පිලිතුරු දුන්නේය. "ඔබ අප හා සම්බන්ධව සිටින්නේ මනසින් පිටවන ශක්තිය ඔස්සේ. ඔබයි අප තෝරාගත් කෙනා, විශ්වයම වෙනුවෙන්. අපගේ නියෝජිතයන් ඔබට මග පෙන්නාවි. ඔබේ සාර්ථකත්වයේ එක් අදියරකදී ඔබට මා නැවත මුණගැසේවි."

මා යමක් සිතීමටත් පෙර සුදු ගිනිදළුව නිවී, ඉන් ඇතිවූ දුමාරය කුටියේ බිත්තිය හරහා ඇදී ගොස් අතුරුදන් විය. ඒත් සමගම මා ගැස්සී අවදි වුණෙමි. දහදියෙන් නැහැවී සිටි මා අවට බැලීමි. කිසිදු වෙනසකින් තොරව මම මගේ යහන මතමය.

එදා එම සිහිනයට පසු අද වනතෙක් ගත වූ දින කිහිපය තුල එක්වරක්වත් එම සිහිනය මට නැවත දිස්වූයේ නැත.

'ඔහු කවුද?'<br>'මම ගියේ කොතැනකටද?'<br>'මුලු විශ්වයම වෙනුවෙන් මාවම තෝරාගත්තේ ඇයි?'<br>'මට දුන් අරමුණ මොකක්ද?'

'මා ඔවුන් වෙනුවෙන් කළ යුත්තේ කුමක්ද?'

'එය සිහිනයක්ම පමණක්ද?'

ආදී වූ පිලිතුරු නොමැති ප්‍රශ්න සියගණනක් මගේ සිත තුලට නිරන්තරයෙන්ම කඩාවැදෙන්නට විය.

# දුරකථන ඇමතුම

එදා හරිම පාළු දවසක්. නමුත්, ඉතා ඉක්මනින් ඒ පාළු බව සංකීර්ණත්වයකට පරිවර්තනය විය. පාසල් නිවාඩු දිනයක් වූයෙන් මම නිවසේ රැඳුනද, දෙමාපියන් රැකියාවට ගිය නිසා මට තනිව නිවසේ සිටින්නට විය. අම්මා උදෑසන පිලියෙල කර ගිය ආහාරයම, මගේ දිවා ආහාරය ලෙස ගෙන මම නිදිබරව පුටුවක් මත දිගාවී සිටියෙමි. අහසේ වැසිබර සේයාවක්වත් නොමැතිව පැහැදිලිව තිබුණත් මහා වරුසාවක් කඩාවැටෙමින් තිබුණි. මම මගේ දුරකථනයට පැමිණ ඇති කෙටි පණිවිඩ බලමින් ඒවාට පිලිතුරු යැවුවෙමි. මගේ කම්මැලිකම තවදුරටත් උග්‍ර වන්නට විය. පොතපතේ වැඩක් කිරීමටද සිත යෙදවිය නොහැකි විය.

"මගේම අංකයට මමම ඇමතුමක් ගත්තොත් මොනවා වෙයිද?" මගේ සිත ඇසුවේය.

එවිට මට මතක් වූයේ මගේ මිතුරියකද මෙය අත් හදා බැලූ විට "පරිශීලකයා කාර්යබහුලයි." ලෙස සදහන් පණිවිඩයක් සමග ඇමතුම විසංධි වුණු බව පැවසූ ආකාරයයි.

"කොහොමත් ඒකම තමා වෙන්නේ." එසේ සිතුණත් එය එක්වරක් හෝ අත් හදා බැලීමේ ආශාව පහව ගියේ නැත. එහෙයින්, මම මගේ දුරකථනය ගෙන මගේම දුරකථන අංකය එහි සටහන් කර ඇමතුමක් ලබාගත්තෙමි.

මද වේලාවක් දුරකථනය ඇමතුම සම්බන්ධ කර ගැනීමට උත්සාහ දැරීය. නමුත්, එක් ක්ෂණයකින් මා නොසිතූ ලෙස යමෙක් අනික් පසින් සම්බන්ධ විය. මා අංකය වැරදිව සටහන්

කරන්නට ඇතැයි යන හැඟීම යටපත් කරමින් හදවතේ ගැස්ම වැඩිවන්නට විය.

"හලෝ?" ගැහැණු ළමයෙක්ගේ පැහැදිලි කටහඩක් ඇසුණි. පළමු තත්පරයේදී එහි කිසිදු අමුත්තක් නොදුටුවද, ඊළග ක්ෂණයේදී මට ඇසුණේ මගේම කටහඩ නොවේදැ'යි සිතුණි. ඒ සිතුවිල්ලත් සමග ගොළු වූ මා පිළිතුරු නොදී බලා සිටියෙමි.

"හලෝ, කවුද කතාකරන්නේ?" ඇය යළි ඇසුවාය. එය මගේම කටහඩ මගෙන්ම විමසුවාක් වැනිය. මටද තිබුණේ ඇගේ පැනයමය. මගේම කටහඬින් කතාකරන මේ ළමයා කවුද?

"මම නතාලියා, ඔයා කවුද?" අවසානයේ මා ගොතගැසෙන හඩකින් ඇසුවෙමි. ඇය තත්පර කිහිපයක් නිහඩව සිටියාය. මගේ ප්‍රශ්නය නිසා ඇය පුදුම වූවා විය හැකියි. ඇය යළි කතාකළේ තරමක කෝපයෙනි.
" හරි, මම නතාලියා...කිටී දැන් මේක නවත්තන්න. මම දන්නවා මේ ඔයා කියලා. ඇයි මේ මහ රෑ නිදාගන්නේ නැතිව කරදර කරන්නේ?" ඇගේ හඩ තර්ජනාත්මකය.

"කිටී!!" ඒ මම මගේ හොදම යෙහෙළියට පවසන හුරතල් නාමයයි. "එහෙනම්, මේක එයාගේ වැඩක්වත් ද?" මගේ යටිසිත එසේ කීවේ එය සිදු විය නොහැක්කක් බව දැන දැනමය.

මම ඇමතුම විසන්ධි නොකරම කඩිසරව නිවසේ ස්ථාවර දුරකථනයෙන් කිටීට ඇමතුමක් ගතිමි. ඇය ඇමතුමට සම්බන්ධ වූවාය.
"ඇයි? මොකද?" කිටීගේ හඬ දුරකථනයේ අනික් පසින් ඇසුණි. මෙය සිදුවිය නොහැක්කක්!
ඇමතුමේ සිටි මා වැනිම නතාලියා කීවේ දැන් මහ රෑ කියා බව මට සිහිපත් වූයේ එවිටය. මම ක්ෂණයෙන් ජනේලය දෙස බලා තවම දහවල බවට ප්‍රත්‍යක්ෂ කරගතිමි. මගේ ඇග සීතල වන බව මට දැණුනි.

"මේ හොල්මනක්ද?" මම ඇට කිසිදු ප්‍රතිචාරයක් දැක්වූයේ නැති නිසා ඇය ඇමතුම විසන්ධි කළාය. මගේ දෑත් මගේ බියපත් හිතට අවනත නොවී නැවතත් මගේම අංකයට නැවතත් ඇමතුමක් ලබාගති. ස්වල්ප වේලාවකට පසු මා බලාපොරොත්තු වූ අන්දමින්ම ඇය නැවතත් ඇමතුමට සම්බන්ධ වූවාය. මෙවර ඇය කෝපයෙන් පුපුරමින් කතාකරනු ඇතැයි සිතුවද දුරකථනයේ අනෙක් පසින් ඇසුණේ සාමාන්‍ය කටහඩකි. මෙවරද එය මගේම කටහඩ විය.

"හලෝ, කවුද කතාකරන්නේ?"

"මම නතාලියා, ඔයත් නතාලියාද?" නිරායාසයෙන්ම මගේ මුවින් පිටවුණි. බියට මා පාලනය කිරීමට ඉඩ නොදෙමින් කුතුහලය විසින් මා පාලනය වන බවක් මට දැණුනි.

"අහ්....ඔව්" ඇය සැකමුසු හඬකින් පැවසුවාය. "කාටද කතාකරන්න ඕන?" මද නිහැඩියාවකට පසු ඇය විමසුවාය. ඇගේ

කෝපය දැන් සිදීගොස් ඇත්තේ මන්දැයි මම සිතීමි. ඇමතුම් දෙක අතර ඇත්තේ විනාඩි කිහිපයක ප්‍රමාදයක් පමණකි. ඒ ක්ෂණයෙන් ඇයට රාත්‍රිය ගත වී අවසන් වුණාද? ඒ අතරතුර මගේ පියාගේ කටහඬ පසුබිමින් ඇසුණි. තාත්තා කොහොමද එතනට ගියේ? මම මගේ පියාගේ නම කීමි. ඇය දුරකථනය රැගෙන යන හඬ ඇසුණි. "හලෝ, කවුද කතාකරන්නේ? මොකක් හරි වුවමනාවක්ද?" ඒ හඬ මගේ පියාගේමය.

"තාත්තේ!"

ඔහු වික්ෂිප්ත වූවා විය යුතුය. එය ඔහුගේ කටහඬේ වූ වෙනසින් කිව හැකි විය. "කවුද මේ?"

"මම නතාලියා, ඔයාගේ දුව."

"මගේ දුව මෙතන ඉන්නවා. මම හිතන්නේ ඔයාට වැරදීමක් වෙලා." ඔහු තරමක් රෞද්‍ර ලෙස පවසත්ම මම "තාත්තේ, දැන් වෙලාව කීයද?" යැයි ඇසීමි. එය ඇසුණේ ඇයිදැයි මටම ගැටලුවක් විය.

"වෙලාව උදේ 7.30යි. වැරදි නොම්මරයක්!" කියා ඔහු ඇමතුම විසන්ධි කළේය.

"7.30යි? එකපාරටම එළිවෙලාද?" එසේ සිතමින් යලිත් වරක් මගේම අංකයට ඇමතුමක් ලබාගතිමි. මගේ බිය පසෙකලා

කුතුහලය දළුලා වැඩෙමින් තිබුණි. තත්පර කිහිපයක පමාවෙන් නැවතත් ඇමතුම සම්බන්ධ විය.

"හලෝ" නැවතත් එය මගේම කටහඬ විය. " හලෝ, මම නතාලියා." මෙවර පැකිලීමකින් තොරව මම කීමි.

"අම්මේ..." ඇය මවට අඬගසනු ඇසුණි.

 මොහොතකින් " හලෝ, කවුද කතාකරන්නේ?" මෙවර ඇසුණේ මගේ මවගේ කටහඬමය. මෙය මගේ දෙමාපියන්ගේ පුදුම කරවීමක් වැනි දෙයක් විය නොහැකිය. මා මෙවන් ඇමතුමක් ගන්නා බව ඔවුන් දන්නේ නැත. මොනයම් හෝ අත්භූත යමක් මෙය පසුපස තිබෙනවා විය යුතුයි.

"අම්මේ දැන් වෙලාව කීයද?"

"රාත්‍රී 7යි.කවුද ඔය?" ඇය ඇමතුම විසන්ධි කර දැමීමට පෙර මා යමක් කිව යුතුයැ'යි මට හැඟුණි. මගේ මනස කිව යුතු දෙය සිතන්නට විය .මනසට පෙර ඉක්මන් වූ මගේ කට ඈට දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කළේය.
"අම්මේ, මම නතාලියා. මම මේ කතාකරන්නේ මගේම නම්බර් එකට කෝල් කරලා. මේ විදිහට මම වගේම නතාලියා කෙනෙක් කෝල් එක ආන්සර් කරපු තුන්වෙනි පාර මේක. මට මේ ප්‍රශ්නේ තේරුම්ගන්න උදව් කරන්න."

"මගේ දුව මෙතන මාත් එක්ක ඉන්නේ. ඔයා වැරදි අංකයකට ගන්න ඇත්තේ." ඇය එසේ කියා ඇමතුම විසන්ධි කළාය.

මම නැවතත් සිව්වන වතාවටත් නැවතත් සුපුරුදු  ඇමතුමම ලබාගතිමි. තත්පර කිහිපයක් නාද වූ එයින් මා විශ්මයට පත් කරමින් "පරිශීලකයා කාර්යබහුලයි. කරුණාකර පසුව අමතන්න." පණිවිඩය සටහන් විය. නැවත නැවත කිහිප වතාවක්ම උත්සාහ කළත් නැවතත් එක් ඇමතුමක්වත් සම්බන්ධ නොවීය.

මං වගේම තව නතාලියාලා ඉන්නවද? මගේත්, මගේ දෙමව්පියන්ගේත් කටහඬවල් වලටම සෑම අතින්ම සමාන තවත් අය ඉන්න පුලුවන් ද? ඇමතුම සම්බන්ධ වුණේ කාටද? කොහෙටද? වෙනත් ලෝකයකටද? ප්‍රශ්න සිය ගණනකින් මගේහිස පිරී යන අතරතුර මගේ දෑත් සහ දෙඇස් අන්තර්ජාලය පුරා මෙම තත්වය කුමක් විය හැකිදැයි සොයාබලන්නට විය.

# යථාර්තය

ඔහු අවදි වූයේ ඔහුගේ කන අසලින්ම මහහඬින් ඇසුණු '‍ට්‍රීක්...‍ට්‍රීක්...' ශබ්දය නිසාය. ඒ වෙලාව උදෑසන පහයි තිහ බව දක්වමින් නාද වූ ඔහුගේ එලාම් ඔරලෝසුවයි. නින්දෙන්ම එය ක්‍රියාවිරහිත කර දැමූ ඔහු නැවතත් බ්ලැන්කට්ටුව පොරවා ගත්තේ තවත් ටික වේලාවක් ඇදටම වී සිටින්නට සිතාගෙනය.

නමුත්, එසැනින් ඔහුට සිහිවූයේ 'අද විශ්වවිද්‍යාලයේ පලමු වාරයේ පලමු දේශන දිනය' බවයි.
'පලවෙනි දවසේම පරක්කු වෙලා ගියොත් ප්‍රොෆෙසර්ගෙන් බැනුම් අහන්න වෙයි.' එසේ සිතූ ඔහු කලබලයෙන් ඇදෙන් බැස ගොස් මුහුණකට සෝදාගත්තේය.

කලු කලිසමකින් සහ සුදු කමිසයකින් සැරසුණු ඔහු පහල මාලයට පැමිණියේ කෑමට යමක් සකසා ගැනීමටය. පෙරදින ගෙනා පාන් රාත්තලෙන් ඉතිරිව තිබූ පාන් පෙති කිහිපයේ බටර් සහ ජෑම් තවරා ඉක්මනින්ම ගිල දමා ඔහු තම උදෑසන ආහාරය නිම කළේය. ඔහු ඔරලෝසුව දෙස බැලුවේය. "8.35යි!!! හොඳටම පරක්කුයි." ඔහු කලබලයෙන් සිය බෑගයද රැගෙන එලියට බැස නිවස අගුලු ලෑවේය. නිවසින් පිටත වූ කුඩා මඩුව තුල මෝටර් රථයක් නවතා තිබෙනු දුටුවත් එය ගණනකට නොගත් ඔහු නිවසට මීටර් 100ක් පමණ දුරින් පිහිටි බස් නැවතුම වෙත වේගයෙන් ඇදුණේය.

ඔහුගේ වාසනාවකට මෙන් බස් නැවතුමට පැමිණෙන විටදීම විශ්වවිද්‍යාලය දෙසට යන බස් රථයක් පැමිණියේය. ඔහු වහා ඊට ගොඩවූවේය. අධික තදබදයක් පැවති එම බසයේ විනාඩි විස්සක

පමණ වෙහෙසකර ගමනකින් පසු ඔහු විශ්වවිද්‍යාලය අසලින් බැසගත්තේය. තමා පරක්කු වී ඇති බව සිතමින් ඔහු විශ්වවිද්‍යාල භූමියට ඇතුලුවූවේය.

විශ්වවිද්‍යාල භූමිය මනරම්ය. ඇවිද යාමට ඇති මංතීරුව දෙපස පලසක් මෙන් දිස්වන මනාව කප්පාදු කල තණකොළය. අතරින් පතර සුවිසල් ගස් හා පදුරු වලින්ද යුක්තය. ඒවායේ කහ, රතු මල් පිපී වසන්ත සමයේ විචිත්‍රවත් බව කියාපායි. මංතීරුව මකුළුදැලක් සේ විශ්වවිද්‍යාල භූමිය පුරා විහිදෙමින් එක් එක් ගොඩනැගිල්ලටවීමග පෙන්වයි. භූමියේ සෑම තැනකම පැහේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සිටිනු ඔහු දුටුවේය. ඔහු රංචු ගැසී විනෝදයෙන් සිනාසෙන සිසුන් කණ්ඩායමක් පසුකර ගියේය. තමතමාගේ දේශන ශාලාවලට ඇදෙන සිසුන් පසුකර ගියේය.ඔහු ඒ මහා සෙනග මධ්‍යයේ තම මිතුරන්ගේ මුහුණු බලාපොරොත්තු වූවේය. නමුත්, ඔහුට තමා දන්නා කිසිවකු මුණ නොගැසුණි. බොහෝ දෙනෙක් ඔහු දුටුවිට යටහත් පහත් සිනහවකින් සංග්‍රහ කළහ. ඇතැම්හු නොදුටුවා සේ ඔහු පසුකර ගියහ. තවත් සමහරු වරදක් කල කලෙක මෙන් සිටි තැන්වලින් ඉවත් වූහ. මුහුණට හමුවන සියලු දෙනා මොනයම් හෝ විශේෂ ප්‍රතිචාරයක් දැක්වීම ඔහුට අපහසුතාවයක් ගෙනදුන්නේය. එමෙන්ම එය ඔහුට ප්‍රහේලිකාවක් විය. තමා අවට පරිසරය කෙතරම් මනරම් වුවත් එහි ප්‍රබෝධය ක්‍රමයෙන් අඩුවන බවක් ඔහුට දැණුනි. තමා අවා කෙතරම් පිරිසක් සිටියත් ඒ දහසක් වූ නාදුනන මුහුණු අතරේ තමා තනි වී ඇතැයි ඔහුට සිතුණි.

ඔහුගේ දෙපා ඔහුව රැගෙන ගියේ මංතීරුවේ එක් බෙදුමක කෙළවරේ වූ තෙමහල් ගොඩනැගිල්ල වෙතය. ඔහුට එම

ගොඩනැගිල්ලේ යම්හුරුපුරුදු බවක් දැණුනි. තම අත් ඔරලෝසුව දෙස බැලූ ඔහු මහත් කලබලයට පත්විය. දේශනය අරඹන වේලාව පසුවී විනාඩි පහලොවක් ගත වී ඇත.
"අද නම් ශාලාවෙන් එලියේ හිටගෙන ඉන්න තමා වෙන්නේ!" යයි සිතමින් ඔහු ගොඩනැගිල්ලේ දෙවන මාලය වෙත දිව ගියේය. ඔහු ශාලාවට පැමිණෙන විටදී සිසුන් ශාලාවේ අසුන්ගෙන සිටියහ. නමුත් කථිකාචාර්යවරයා පැමිණ නොතිබුණි. ඔහු පැමිණෙන විට හිදගෙන සිටි සිසුන් නැගී සිටියහ. තමාගේ පැමිණීමේ ඇති විශේෂත්වය කුමක් දැයි සිතමින් ඔහු පිටුපසම තිබුණු අසුනක් වෙත ගියේය. ශාලාවේ සිටි සිසුන් ප්‍රශ්නාර්ථකාරී පුහුණුවලින් ඔහු දෙස බලා සිටියහ.

"ඇයි හැමෝම මං දිහා අමුතු විදිහට බලන්නේ...?" තමාට ඇතිවන අපහසුතාවය මගහරවා ගැනීමට ඔහු ජනේලයෙන් එපිට බැලුවේය. එවිට ජනෙල් වීදුරුවෙන් ඔහු දුටුවේ තරුණ ශිෂ්‍යයන් පිරිසක් මධ්‍යයේ හිදගෙන ජනේලයෙන් තමා දෙස බලා සිටින මැදි විය ඉක්මවූ මිනිසෙකි. ඔහු වහා අවට බලා නැවත ජනෙල් වීදුරුව දෙඅ බැලුවේය. ඒ මැදිවියේ මිනිසා වෙනකකු නොව තමාම බව ඔහුට පසක් විය. තමාගේ මුහුණේ ලේ එක්වරම සිදී යන බවක් ඔහුට දැණුනි. ඔහු පුටුවේ ඇන්ද මතට කඩා වැටුණේය.

"සර්? සර්, හොදින්ද?" ඔහුට පසෙකින් සිටි ශිෂ්‍යයා ඇසුවේය.

"සර්?? එතකොට මමද අර වයසක මනුස්සයා? කොහොමද එහෙම වුණේ?" ඔහු ශිෂ්‍යයාගේ පැණයට පිලිතුරු නොදී සිතන්නා විය.

"සර්ගේ මූණත් සුදුමැලි වෙලා."

"සර්ට අසනීපයක්ද දන්නෑ."

"ඔය වතුර බෝතලේ දෙන්න."
"අද දේශනය කරන එකක් නැතිවෙයි නේද?" වැනි දහසකුත් වදන් ඔහුගේ සවන වැකුණද ඒවාට පිළිතුරු දීමට තරම් ශක්තියක් ඔහුට නොතිබුණි.

"මට මේ මොකද වෙලා තියෙන්නේ?" තම හිසේ බර එන්න එන්නම වැඩිවන බව ඔහුට දැණුනි.

එක්වරම තම හිසේ පිටුපස තරමක් තදින් යමක වැදෙනු දැනී ඔහු දෑස් විවර කළේය. ඔහු තවමත් දේශන ශාලාවේමය. වහා අවට බැලූ ඔහු දුටුවේ තමාද අනෙක් සිසුන් මෙන්ම අතෙහි කොලයක් සහ පෑනක් සහිතව හිඳ සිටින බවයි. කථිකාචාර්යවරයෙක් දේශනයක් සිදුකරමින් සිටියේය. අනෙක් සිසුන් යම් යම් දෑ කොලයේ සටහන් කරමින් සිටියහ. ජනෙල් වීදුරුවෙන් තමා දුටු මිනිසා මතකයට නැගුණු ඔහු ශාලාවේ බිත්ති පුරා නෙත් දුවවමින් ජනේලයක් සෙව්වේය. මෙවර ඔහු දුටුවේ වේදිකාව් දෙසට නෙත් යොමා සිටින සිසුන් මධ්‍යයේ සිට තමා දෙස ජනෙල් වීදුරුවෙන් බලා සිටින තරුණයෙකි. ඔහු වටපිට බලා ඒ තමාම යැයි ප්‍රත්‍යක්ෂ කරගත්තේය.

"කවුද එතකොට අර වයසක මිනිහා?" ඔහු සිතුවේය.

විනාඩි කිහිපයකට පසු දේශනය නිමා කරමින් කථිකාචාර්යවරයා ශාලාවෙන් පිටව ගියේය. සිසුන්ද ශාලාවෙන් ඉවත්ව යන්නට විය.

"උඹ එන්නැද්ද?" ඔහුට පසෙකින් සිටි තරුණයා අසුනෙන් නැගිටිමින් ඇසුවේය.

"කොහෙටද?"

"කැන්ටිමට. තාම නිදිමතේද බන් ඉන්නේ? ලෙක්චර් එක පටන් ගත්ත වෙලේ ඉඳන් නිදාගෙනත්..."

ඔහු එයට පිලිතුරු ප්‍රශ්නයක් ඇසීමට සූදානම් වෙත්ම බැරෑරුම් හඬකින් "දැන් වෙලාව ඉවරයි. පේපර්ස් එකතු කරනවා." යයි පවසනු ඇසුණි. ඔහු වටපිට බැලුවද එය පැවසූ තැනැත්තා පෙනෙන්නට නොවීය.

මොහොතකින් අයෙක් තමා සොලවන බවක් ඔහුට දැණුනි. "ළමයා...ළමයා?" ඒ හඬ තමා අසලින්ම ඇසුණේ යැයි ඔඅහුට සිතුණේය. ඔහු දැස් වසාගෙන අසා සිටියේය. නැවතත් එම හඬ තමා අසලින්ම ඇසුණු නිසා ඔහු දැස් විවරකර බැලුවේය. ක්ෂණයකින් මනසේ විදුලියක් කෙටුවා සේ ඔහුට සියල්ල මතකයට නැගෙන්නට විය.තමා සිටින්නේ උසස්පෙල විභාග ශාලාවේ බවත්, තමාගේ ප්‍රශ්න පත්‍රය බාර දිය යුතු බවත් ඔහුට සිහියට නැගුණි. ඔහු තම මේසය මත වූ භෞතික විද්‍යාව ලෙස සදහන් ප්‍රශ්න පත්‍රය අතට ගෙන එය පෙරලා බැලුවේය.

"දෙයියනේ!!!" ඔහුට තමාගේ මුලු සිරුරම පිලිස්සී යන සෙයක් දැනෙන්නට වූයේ තමා මුලු ප්‍රශ්න පත්‍රයටම ලියා ඇත්තේ විභාග අංකය පමණක් බව දැකීමෙනි. ඔහු ගිණියම් වූ දෑසින් ප්‍රශ්න පත්‍රය දෙස බලා සිටියදී ඔහු අවදිවනතෙක් කෝපයෙන් බලා සිටි විභාග පරීක්ෂකවරයා ඔහුගේ අතින් ප්‍රශ්න පත්‍රය ඩැහැගත්තේය. ඔහුගේ හිස කරකැවෙන්නට විය.

"මම පේපරේ මොනවත් ලියලා නෑ!! කොහොමද මෙහෙම වුණේ දෙයියනේ??"

ඒ අතරතුර ඉදිරි පෙලක සිටි ඔහුගේ මිතුරකු කපටි සිනහවකින් මුව සරසාගෙන ඔහු වෙත ආවේය. මිතුරාගේ දෑස කපටිකම මුසු වූ ප්‍රීතියකින් දිලිසෙමින් තිබුණි.
"කොහොමද පේපරේ? මට නම් මේ සැරේ B එකක්වත් ශුවර්. ගිය අවුරුද්දේ පේපරේටත් වඩා මේක ලේසියි."

මිතුරාට පිලිතුරු නොදුන් ඔහු තම දෑස් පිසදා බැලුවේ තමා තවම දකින්නේ සිහිනයක්දැයි සිතමිනි. නැත! තමා යථාර්ථයේ සිටින බවත්, තමා තෙවන වරටත් උසස් පෙල අසමත් බවත් ඔහුට වැටහුණි.

**එය සිහිනයක්ම පමණක්ද? එසේත් නැතිනම්...?**

# අමරණීයයකුගේ මරණය

"මගේ කතාව දන්නේ මේ හතරදෙනා විතරයි. මගේ රහස තව විනාඩි පහලොවකින් මාත් එක්කම නැති වෙලා යන්න අරින එක මේ ලෝකෙට මම කරන අසාධාරණයක්... ඔවුන් විද්‍යාගයින්..! මට හොයාගන්න බැරිවුණු දේ මෙයාලා හොයාගනීවි. මට කරන්න පුලුවන් එකම දේ..." ඩේවිඩ් මෝල්ස්වර්ත් තමාටම එසේ කියාගනිමින් දිගු සුසුමක් හෙලුවේය.
"ඔයාලා නොහිතන දෙයක් හෙට මගේ කූඩාරමෙන් ඔයාලට හමුවේවි. ඔයාලාගේ ජීවිත පවතින තුරාවට මේ ගැන සෙවීම අතහැරලා දමන්නේ නෑ කියලා මට පොරොන්දු වෙන්න..!" ඔහු හැකි පමණ ශබ්ද නගා කීවේය.

"අපි පොරොන්දු වෙන්නම්! සදහටම...ජීවිත කාලය පුරාවටම..." ඇසුණු ඒ කලබලයත්, වික්ෂිප්ත බවත් පිරි කටහඩ ඇසීමෙන් තම ශරීර වේදනාවන් යම්තමින් පහව ගියේ යැයි ඔහුට සිතුණි.
තම අවසන් විනාඩි කිහිපයේදී නැවුම් බලාපොරොත්තුවක් සමග හිද මියයාමට ලැබෙන්නේ මෙලොව කෙතරම් සුලු පිරිසකටද?
එසේ සිතූ ඔහු තම අවසාන ශක්ති පුංජයත් වචන කිහිපයකට ගොනු කර මුදා හැරියේය.
"හොදයි, දෙවියන් වහන්සේ ඔබත් සමග සැමදා ඉදීවි! සුබ ගමන්..!"

ඩේවිඩ් මෝල්ස්වර්ත් එදා පටන් අද දක්වාම කිසිදු හඩක් පිට නොකලත්, තම ශාපලත් ජීවිතය ලෝකවාසී සමස්ත ප්‍රජාවගේ ආශිර්වාදය කරවීමේ ඔහුගේ අපේක්ෂාව අද ලොවක් ඉදිරියේ හඩ නගන්නට සූදානම්...

..........********..........********..........

"මගේ දිග කතාව මම කියන්නම්. හැබැයි ඔයාලා ඒක විශ්වාස කරයි කියලනම් මට හිතෙන්නේ නැහැ." ඬේවිඩ් මෝල්ස්වර්ත්ගේ හඬ දශක ගණනාවකට පසුවත් නියුමර්ගේත් ලූයිස්ගේත් දෙසවන් තුල දෝංකාර නංවන්නට විය.

මේ ඔවුන්ගේ දෙසවනේ රැව් දෙන ඒ කතාවයි...අමරණීය කතාවයි...

## අමරණීයයකුගේ මරණය

# Chapter 1

මේ 2035 වර්ශයේ මැද භාගයේ දිනයකි. Heaven Way විද්‍යාගාරය පුරා සතුටක් පැතිරෙමින් තිබුණි. ඒ ඔවුන් ලද ජයග්‍රහණය නිසාම නොවේ...හෙටින් ඇරඹෙන ලෝකය පෙර මෙන් නොවන බව සිතීම නිසාය, තීරණාත්මක ඉල්ලීමක් ඉෂ්ඨ කිරීමට සමත් වූ නිසාය, ඒ අතරතුර අයෙක් තමා නොබෙල් ත්‍යාගයක කොටස්කරුවකු වෙතැයි සිතා සතුටු වූවාද විය හැකිය.

"රොනල්ඩ්, ඔයා ප්‍රධාන විද්‍යායන්ගේ සංගමයට දැනුම් දුන්නාද?" වියපත් හඩක් විමසීය.

"ඔව්, මහාචාර්යතුමා. එයාලා තව විනාඩි කිහිපයකින් ඒවි."

බලාපොරොත්තු වූවාක් මෙන්, විනාඩි පහළොවකට පමණ පසු අධි සුඛෝපභෝගී මෝටර් රථ දහයක් පමණ විද්‍යාගාරය ඉදිරිපස එක පෙලට ගාල් කෙරුණි. තත්පර කිහිපයක පමාවෙන් ඒවායේ පැමිණි අමුත්තෝ විද්‍යාගාරයේ දොරටුව අභියස සිටියහ.

"ආරංචිය ලැබුණු විගසින්ම අපි ආවා." ඒ ජෛව විශේෂඥ කැමී ග්‍රීන් ය. පිරිස පිලිගැනීමට දොරටුව අසල සිටි වයෝවෘද්ධ මිනිසාට සිනහමුසු මුහුණින් අතට අත දෙමින් ඇය කීවාය.

"සාදරයෙන් පිළිගන්නවා..." ව්‍යාපෘත් මිනිසා අපැහැදිලි හඬකින් කීවේය. "යමු ඇතුලට..." පැමිණ සිටි සියලු දෙනා හට ආචාර දැක්වීමෙන් පසු ඔහු කීවේය.

ඔවුන්ගේ ගමන් මග ඉතා දිගු වූවකි. ව්‍යාපෘත් මිනිසා පිටුපසින් කැමී ග්‍රීන් ඇතුලු විසිදෙනෙකුගේ පිරිසක් කෙලවරක් නොපෙනෙන කොරිඩෝ සහ විදුලි සෝපාන ඔස්සේ පොලෝ මට්ටමින් පහල බිම් මහලකට පැමිණියහ.

"මේ මගේ මිත්‍ර මහාචාර්ය ලුයිස් මැක්හෙලම්." තමා ඉදිරිපස ඇති රෝද පුටුවේ හිද සිටින තමා මෙන්ම වයෝවෘද්ධව සිටින මිනිසා පෙන්වමින් ව්‍යාපෘත් මිනිසා පිරිසට කීවේය. හේ වනාහි, නොනිදා වෙහෙසීමේ හෝ ව්‍යාපෘත් බව හේතුවෙන් සමට ගිලී ඇතිවාක් මෙන් පෙනෙන කුඩා ගැඹුරු දෙනෙත් වටා දම් පැහැ අඳුරු ලප වලින් යුත්, එල්ලා හැලෙන සමක් සහිත විඩාබර මුහුණකින් යුත්, දශක අටකට නොඅඩු ජීවිතයක් ගත කරමින් සිටින්නෙකි. ඔහු ප්‍රකට සම්මාන ලාබී විද්‍යාඥයෙකි. රැස්ව සිටි පිරිස විසින් වසර ගණනාවක් මුලුල්ලේ මොහුව දැන සිටින හෙයින් හදුන්වා දීමක් අනවශ්‍ය වුවත් මේ වෙලාව එවැන්නකට මනාව ඔබින්නේයැයි බිම් මහලේ සිටියවුන් සිතූහ.

ව්‍යාපෘත් කථකයා ඊලගට සිය සුරත දිගුකලේ ලුයිස් මැක්හෙලම්ට පිටුපසින් සිටගෙන සිටි පහලොස් දෙනෙකුගෙන් යුක්ත පිරිස වෙතටයි. "මේ මහාචාර්ය නිකොලායිගේ මුණුපුරා, සාෂ්කා." පිරිසේ ඉදිරියෙන්ම සිටි උස්,කඩවසම් සිරුරකින් යුත් තරුණයා පෙන්වමින් ඔහු කීවේය. "මේ කේට් වින්සන්ට්." සාෂ්කා නමින් පෙන්වා දෙනු ලැබූ තරුණයාට පසෙකින් සිටි දිගු කෙස්

කලඹකිනුත්, සුන්දර සිනහවකිනුත් යුත් තරුණ කාන්තාව එලෙස ඔහුගේ හඳුන්වා දීමට බඳුන් විය.
"ඒ වගේම මේ ඉන්නේ රොනල්ඩ් බැක්වෙල්. මොවුන් තිදෙනා අපේ පරීක්ෂණයේ ප්‍රධාන සහයකයන්." කේට්ට පසුව සිටගෙන සිටි තරමක මැදිවියේ පෙනුමකින් යුත් හීන්දැරි මිනිසා දෙසට සුරත ගෙනයමින් පැවසුවේය.

හඳුන්වා දීම ප්‍රමාණවත් යැයි සිතූ වියපත් මිනිසා සිය තරුණ සහායක විද්‍යාඥයින්ට පිටුපසින් සිටි පිරිස දෙසට සිය අත යොමු කලේය. "අනික් හැමෝම අපේ විද්‍යාගාර සහයකයින්."

ඉන්පසු අමුත්තන් වෙත හැරුණු ඔහු "අවසාන වශයෙන්..." යලිත් සිය අපැහැදිලි කටහඬින් කතාකරන්නට විය. "...මම මහාචාර්ය නියුමර් හෙන්ලේන්...ඔබ සියලූ දෙනාම සාදරයෙන් පිලිගන්නවා."

එතැන් පටන් පිරිස හා කතා කිරීමට ලුයිස් මැක්හෙලම් ඉදිරිපත් විය.
"පරීක්ෂණ කුටියට යන්න කලින් හැමෝම ආරක්ෂක ඇඳුම් ඇඳගන්න. බය වෙන්න තරම් දෙයක් නොතිබුණත්, තමතමන්ගේ ආරක්ෂාව වෙනුවෙන්..."
බිම් මහලේ සිටි තිස් පහක් පමණ වූ සියලුම දෙනා ඊලග විනාඩි පහක පමණ කාලය වැය කලේ අධිආරක්ෂිත ඇඳුම් ඇගලා ගැනීමටය.

නියුමර් සහ ලුයිස් පිරිසේ පෙරමුණ ගනිමින් බිම් මහලේ පටු අඳුරු කොරිඩෝව දිගේ ගමන් කළහ. විශාල යකඩ ද්වාරයක් අභියසට

පැමිණ ඔවුහු නතර විය. නියුමර් විසින් බිත්තියේ පසෙක සවි කර තිබුණු කුඩා යන්ත්‍රයේ කේතයක් සටහන් කල සැනින් ද්වාරයේ පලු දෙපසට වී කුටිය තුලට යාමට පිරිසට ඉඩ ලැබුණි. එය තරමක් අඳුරු කුටියකි. තත්පර කිහිපයකින් අඳුරට දෑස් හුරු වූ විට අමුත්තන් ඉදිරියේ වූයේ විශාල ර්යම් කුටීරයක් සහ මේසයක් මත වූ පරිගණක තුනක්,පොත් කිහිපයක් සහ කුඩා බෝතලයක සිර කරන ලද කුරුමිණියෙක් පමණකි. තමතමන් බලාපොරොත්තු වූ දසුන් දැකගත නොහැකි වූයෙන් පිරිස මදක් නොසන්සුන් විය.

"මහාචාර්ය ලූයිස්, මේ පරීක්ෂණය පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කරනවානම් එය අපට වඩාත් පහසුවක්." පිරිසේ සිටි එක් විද්‍යාගයෙක් පැවසුවේය.

"හොඳයි, ඔබට සියලු දේ දැනගන්නට පුලුවන්. ඊට කලින් මම කැමතියි අපේ ඖෂධය දැකගන්නවා නම්..." ලූයිස් එසේ කියමින් රොනල්ඩ් හට සංඥාවක් කළේය.
ක්‍රියාත්මක වූ රොනල්ඩ් ර්යම් කුටීරයේ කුඩා කවුලුව විවෘත කර සිහින් විනිවිද පෙනෙන බෝතලයක් ගෙන පිරිස ඉදිරියේ වූ මේසය මත තැබුවේය. තත්පර කිහිපයක් ගත වන තුරුත් තමා ඉදිරියේ ඇති නිල් පැහැ ද්‍රාවණයකින් අඩක් පිරුණු සෙන්ටිමීටර 5ක් පමණ උස් බෝතලය දෙස බලා සිටින පිරිසෙන් ප්‍රතිචාරයක් නොලද හෙයින් ලූයිස් නිහඬතාවය බිඳීමට තීරණය කළේය.

නමුත්,දශක හතරකටත් අධික කාලයක් තිස්සේ සිදුවුණු දෑ කීමට පටන්ගන්නේ කොතනින්දැයි ඔහුට සිතාගත නොහැකි විය. ඔහු පැවසීමට යමක් ගලපමින් සිටින අතරතුර නියුමර් හඬ අවදිකළේය.

"සංගමයේ ප්‍රධාන නිලධාරීන් තිදෙනෙක් පමණක් අපත් සමග කාර්යාලයට පැමිණෙනවානම් අපි කැමතියි. මහාචාර්ය කැමී?.." ඔහු මේසය මත වූ කුඩා බෝතලය සියතට ගනිමින් පැවසුවේය.

"ඔව්, ඔබේ කැමැත්තක්. යමු." කැමී ග්‍රීන් ඊට එකගත්වය පලකළාය.

කැමී ග්‍රීන්, ජේසන් නිවුරෝල් සහ ටිෂ්බයින් ග්ලේන් අන්තර්ජාතික විද්‍යා සංගමයේ ප්‍රධාන විද්‍යාඥයින් තිදෙනා විය. මෙලොව සිදුකරන සියලු රසායනාගාර සොයාගැනීම් සමාජයට යැවීමට පෙර සංගමය දැනුවත්කල යුතු වූ අතර සමාජය තුල ගැටලු පැනනැගිය හැකි සොයාගැනීම් සමාජයෙන් වසන් කර තබාගනිමින් ඉදිරි පරීක්ෂණ කරගෙන යාමටත් සංගමයේ අනුදැනුම අවශ්‍ය විය. නීතිමය කටයුතුවලදී පර්යේෂණ සිදුකරන විද්‍යාඥයින් උදෙසා සංගමය පෙනී සිටින නමුත් සංගමයේ දැනුවත්භාවයකින් තොරව පරීක්ෂණ සමාජගත කිරීම දඩුවම් ලැබිය හැකි වරදක් ලෙස පිලිගැණුනි.

මහාචාර්ය ලුයිස්, මහාචාර්ය නියුමර් සහ සංගමයේ ප්‍රධාන විද්‍යාඥයන් තිදෙනා පිරිසෙන් වෙන්වී කුටිය කෙලවර තිබුණු විදුලි සෝපානයට නැගුණහ. ඔවුන් රැගත් සෝපානය විවෘත වූයේ කුටියට පහල මාලයේ තිබුණු තවත් විශාල කුටියක් වෙතටයි. එය විශාල රසායනාගාරයක් වූ අතර රසායනාගාර උපකරණවලින් පිරී තිබුණි. එහි වූ සෑම මේසයක් මතම සටහන් ඇදි කඩදාසි, ෆයිල් කවර ගොඩගසා තිබුණි. පරිගණක, ප්‍රොජෙක්ටර හා 3d දෘශ්‍ය උපකරණ වලින් ද සමන්විත වූ එම රසායනාගාරය ලොව හොදම රසායනාගාර කිහිපය අතර ඉහලින්ම පවතින බව ප්‍රධාන

විද්‍යාඥයන් තිදෙනාට අමුතුවෙන් කිවයුතු නොවීය. මහාචාර්ය නියුමර් අනුගමනය කරමින් ඔවුහු රසායනාගාරයේ කෙලවරම තිබුණු මේසය වෙත පැමිණියහ. මේසය වටා අසුන්ගත් ඔවුහු කතාවට මුලපිරූහ.

"මම හිතනවා ඔබ මේ පරීක්ෂණය පිලිබඳව සියලු කරුණු සවිස්තරාත්මකව අපිට ඉදිරිපත් කරාවි කියලා. මුල ඉඳලාම...." කැමී ග්‍රීන් පැවසුවාය.

"අපේ සොයාගැනීම ගැන කියන්න කලින් මට දිග කතාවක් කියන්න තියෙනවා. ඒවගේම, ඔයාලා ඒ කතාව විශ්වාස කරාවි කියලා මම හිතනවා." මහාචාර්ය ලුයිස් එසේ පවසා දශක කිහිපයකට පෙර අතීතය ආවර්ජනය කරන්නට පටන්ගත්තේය.

එදා, 1991 වර්ෂයේ ජනවාරි 18 වෙනිදා.වසර හතලිස් පහකට විතර පෙර මමත්, මගේ මිත්‍ර නියුමර් හෙන්ලේන් ඇතුලු තවත් විද්‍යාඥයින් කිහිප දෙනෙක් සහ මගපෙන්වන්නන් සහිතව විසිපස්දෙනෙක් වුණු කණ්ඩායම ඇමසන් වනයට ඇතුල් වෙලා ඒ වනවිටත් දින 3ක් ගතවෙලා තිබුණා. කණ්ඩායමේ එක් එක්කෙනා පැමිණ තිබුණේ තම තමාගේ පරීක්ෂණ කටයුතුවලට අවශ්‍ය කරන දෑ සපයා ගන්න. ඒ වගේම මමත්, නියුමර්ත් එහි ගියේ දුර්ලභ සංයෝගයක් නිපදවීමට අවශ්‍ය කරන පාෂාණ කිහිපයක් රැගෙන එන්නයි. ඒවා ඇමසන් වනාන්තරයේ මධ්‍ය කොටසේ තියෙන බව අපි දැන සිටියත් ඒ දිශාවට ගමන් කිරීම බොහෝ සෙයින් අපහසු වුණා. දින තුනක් පුරා වෙහෙස වුණත් පාෂාණ සහිත කොටසට පැමිණෙන්නට අපිට නොහැකි වුණා.

එදින රාත්‍රියේදී ගංගාවක් සමීපයේ අපි කඳවුරු බැඳ එහි රාත්‍රිය ගත කලා. අප කඳවුරු බැඳි තැනට නුදුරින් තිබුණු ගංගාවෙන් එහාට කැලය තවතවත් ඝන වන නිසාත්, විෂඝෝර සත්ත්වයන් බහුලව වෙසෙන බැවින් සහ ගමන් කිරීමට අපහසු නිසාත් එතැනින් එහාට කණ්ඩායම රැගෙන යාමට මගපෙන්වන්නන් අකමැති වුණා.

"මේ ගංගාව තමයි මායිම. මෙතැනින් එහාට ගිය කිසිම කෙනෙක් ආයෙත් පනපිටින් දකින්න ලැබිලා නැහැ. ඒ නිසා මෙතනින් එහාට ඔයාලව එක්කරගෙන යන්න අපිට අවසර නැහැ." ඔවුන් කීවා.

මමත්, නියුමර්ත් ඒ වනවිටත් එකදු පාෂාණයක්වත් සොයාගෙන තිබුණේ නැහැ. මෙතෙක් දුර අපි ආ ගමන අතරමග නවතා දැමීම පලරහිත නිසා අපි ඊට එකග නොවුනත්, පසුදින සිට යලිත් ආ මගේම ගමන් කර වනාන්තරයෙන් පිටවීමට අනෙක් සියල්ලෝම කැමැත්ත පළකළහ.

"ඒත් අපිට කොහොමහරි පාෂාණ හොයාගන්න ඕන. ඒක වැදගත් පරීක්ෂණයක්...!" මම කීවා.

"ඒක කරන්න දෙන්න බෑ ලුයිස් මහත්මයා. එහෙට යන එක භයානකයි." ඔවුන් තරයේම කියාසිටියා.

බොහෝ වෙලාවක් වාද කලාට පස්සේ ඔවුන් පරාජය පිලිගත්තා. "හරි එහෙනම්, කැමති කෙනෙක්ට ගගෙන් එහාට යන්න පුලුවන්.

ඒත් එහාට යන අය පිළිබඳ වගකීම එයාලටම බාර ගන්න වෙනවා."
මමත් නියුමර්ත් තනිවම පසුදින කැලය තුලට යාමට තීරණය කරගත්තා.

"මමත්, මගේ මිත්‍රයාත් හෙට ගඟෙන් එහාට යනවා." මම අවසන් තීරණය ප්‍රකාශ කළා.

පසුදින උදේ එක් කුඩා කූඩාරමක්, ටින් ආහාර, ලුණු, ආත්මාරක්ෂක උපකරණ ආදිය එක්කරගෙන අපි ගඟෙන් එහාට යාමට සූදානම්වුණා. ගමන අතරතුර අපත් සමග මිත්‍ර වුණු ගිල්ක්‍රිස්ට් සහ නිකොලායි නම් පර්යේෂකයන් දෙදෙනාත් අපත් සමග ස්වේච්ඡාවෙන්ම එක්වුණා. අපි සිවුදෙනාට සුබපැතූ අනෙක් පිරිස ආපසු යාමට පිටත් වුණා. අපිට තරණය කරන්නට තිබුණු ගංගාව ඒතරම් ගැඹුරු නැති තැන තැන විශාල ගල් සහිත එකක් වුණු නිසා වැඩි අපහසුවක් නැතිව ගඟෙන් එහාට යන්න පුලුවන් වුණා. මගපෙන්වන්නන් කියූ දෙය ඇත්තෙන්ම සත්‍යයක්. කැලය තුලින් යාමට බොහෝ අපහසු වුණා. අසා හෝ දැක නැති ශාක, සතුන් පෙර හමුවුණාටත් වඩා දැකගන්න පුලුවන් වුණා. දවස පුරාම වෙහෙසව කැලය තුලට ඇවිද ගියත් සැලකියයුතු දුරක් ගොස් අවසන් කරන්නට අපිට නොහැකි වුණා. දිනය පුරා අපි ආ ගමන් මගේ කොතැනකවත් කඳවුරු ලාගන්න තරම් සුදුසු තැනක්වත් තිබුණේ නැහැ. රාත්‍රිය එළිමහනේ අනාරක්ෂිතව සිටීම නිසා යම් සතෙකුගේ ප්‍රහාරයකට ලක්වෙන්න ඉඩ තිබෙන නිසා අපි අඳුර වැටෙන්නට පෙර කූඩාරම් ගැසීමට තැනක් සෙවුවා. අඳුර වැටෙන විට නොදන්නා සතුන්ගේ ශබ්ද පෙරටත් වඩා

ඇසෙන්නට වූයෙන් අපිව ආරක්ෂා කරදෙන ලෙස අපි දෙවියන්ට යාගයා කළා. අවසානයේදී නොසිතූ යමක් අපි ඉදිරියේ දිස්වුණා.

"අර බලන්න, අර පොඩි කඳු ගැටය...ඒක කොඩියක් නේද? " නිකොලායි ඇසුවා.
"අපි එතැනට යමු. සමහරවිට කලින් කලෙක ආපු කෙනෙක් කදවුරු බැදගත්ත තැනක් වෙන්න ඇති." නියුමර් කීවා.

"ඔව්, එතන ආරක්ෂිතයි නම් අපිට කූඩාරම ගහගන්න පුලුවන්." මම කීවා.

මද දුරක් ඒ දෙසට යනවිට එතැනට යාමට පැහැදිලි අඩිපාරක් තියෙන බව අපිට පෙනුණා. ඒතරම් ඝන කැලයක් මැද එවැනි දෙයක් දකින්න ලැබීම හරිම අමුතු දෙයක් විදිහටයි මට දැනුණේ.

එක්වරම ගිල්ක්‍රිස්ට් මා නැවැත්තුවා. "ලුයිස්, ඔයාගේ සපත්තුව දිගේ අමුතු සතෙක් උඩට නගිනවා. හෙලවෙන්න එපා."

මම නොසෙල්වීම සපත්තුව දෙස බැලුවා. ඌ අමුතු ආකර්ෂණීය දිලිසෙන නිල්පැහැ කෘමියෙක්. විෂඝෝර සත්ත්වයෙක් සේ නොපෙනුනත් ඌගේ යම් විශේෂත්වයක් ඇතැයි මට සිතුණා. ඊලග තත්පරයේදී ඌ මගේ සපත්තුවෙන් බැස වේගයෙන් අසල පදුරක් අතරට රිංගා නොපෙනී ගියා.
"මම මීට කලින් ඒ වගේ සතෙක් දැකලා නැහැ."

"එන්න, අපි ඉක්මනට යමු. තවත් අඳුරු වැටෙන්න කලින්." නියුමර් එසේ කියමින් ඉස්සරවුණා.

කුඩා කඳු ගැටය මුදුනට වැටී තිබුණු අඩිපාර දිගේ අපි කොඩිය ගසා තිබුණු තැනට ලගාවුණා. එතැන තිබුණු දෙයින් අපේ ඇස් අදහගන්න බැරිවුණා. කඳු ගැටයේ අනික් පස බෑවුමේ තිබුණේ කූඩාරම් දෙකක්, කඳවුරු උපකරණ ඇතුලු අංගසම්පූර්ණ කඳවුරු බිමක්. වසර ගණනාවකින් කිසිවෙක් පැමිණ නැතැයි කී ප්‍රදේශයේ කඳවුරු බිමක් තිබීම පුදුමයක් නෙවෙයිද?

"ලුයිස්, මෙතන කඳවුරක්...!" නියුමර් හුස්මක් ඉහලට අදිමින් කීය.

"මේක එක් රැයක් ගතකරන්න හදපු එකක් නෙවෙයි වගේ." ගිල්ක්‍රිස්ට් කීය.

"ඔව්, කූඩාරම් මෑතක සවිකරපුවා වෙන්න බැහැ. ඒවා පරණ පාටයි." මම කීවා.

"අර, දැක්කද? එක කූඩාරමක් ඇතුලින් පුංචි එලියක් එනවා. කවුරුහරි ඉන්නවද දන්නේ නැහැ." නිකොලායි නොඇසෙන තරම් සිහින් හඬකින් කීය.

"ගිහින් බලමු." නියුමර් කූඩාරම ලගට යමින් කීවා. අපිත් ඔහු පසුපස්සෙන් ගියා.

අපි එලියක් විහිදෙන කූඩාරම අසලට යද්දීම එය ඇතුලත සිටි කෙනෙක් "එලියේ කවුරුහරි ඉන්නවාද?" කියලා ඇහුවා. ඔහුගේ උච්චාරණයේ තිබුණේ එක්දහස් අටසිය,නවසිය කාලවල එංගලන්තයේ තිබුණු ආකාරයේ පැරණි උච්චාරණයක්.

ඒ අනපේක්ෂිත ප්‍රශ්නයට අපිට ක්ෂණිකව පිලිතුරක් දෙන්න නොහැකි වුණා. ඒ කටහඩ නැවතත් ඒ ප්‍රශ්නයම ඇසූ පසුවයි අපි උත්තර දුන්නේ.
"ඔව්, අපි පරීක්ෂණ සඳහා පැමිණි විද්‍යාඥයින් කණ්ඩායමක්.... මහත්මයා, ඔබ කවුද?"

එවිට කූඩාරම විවෘත කරගෙන උස් කඩවසම් සිරුරක් ඇති තරුණ වියේ මිනිසෙක් පිටතට ආවා.
"මම ඩේවිඩ් මෝල්ස්වර්ත්." ඔහු කීවා. "රෑට කූඩාරම් ගසාගන්නේ නැතිව මේ කැලේ ඇවිදින එක නම් හොඳ නැහැ."

"අපි කූඩාරම් ගසාගන්න තැනක් හොය හොය යනකොටයි මෙතැන හම්බවුණේ."

"මෙතැන ආරක්ෂිතයි. ඔයාලට කූඩාරමක් ගහගන්න පුලුවන්."
කූඩාරම එසවීමට අපිට උදව් කරන අතරේ ඔහු අපත් සමග කතාබහ කළා.

"ඔයාලා කැලේ මේ පැත්තට ආවේ ඇයි? මෙහෙ තරමක් අනතුරුදායකයි නේ."

"ඔව්, අපේ පරීක්ෂණයකට අවශ්‍ය පාෂාණ ටිකක් හොයාගන්නයි අපි ආවේ. ඒවා හරිම දුර්ලභ ගල් වර්ගයක්. ඇමසන්වල මැදටම වෙන්න තමා මේ ගල් තියෙනවා කියලා අපි හොයාගත්තේ."

"එහෙමද? ඒ පාෂාණ තියෙන තැනට තව ගොඩක් දුරද?"

"පාෂාණ තියෙන තැන හරියටම දන්නේ නැති නිසා හොයන්න තවත් දවස් කීපයක් ගතවෙයි."

"මෙතන ඉන්නේ මම විතරයි. ඔයාලට ඕන වෙලාවක එන්න පුලුවන්."

"ඩේවිඩ් මහත්මයා, ඔයත් පරීක්ෂණයකට ආ කෙනෙක්ද?"

"අ, අහ්.... ඔව්.." ඔහු එය කීවේ තරමක් අපහසුතාවයෙන්.

"මේ වගේ කැලයක තනියම ඉන්න එක අපහසු නැද්ද?"

"කැලයට හුරු වුණාම ඒක ඒතරම්ම දෙයක් නෙවෙයි."

"අපිත් සමග ආව මගපෙන්වන්නන් ගගෙන් මෙහාට එන්න අකමැති වුණ නිසයි අපි හතරදෙනෙක් විතරක් ආවේ. එයාලා කියුව විදියට මේ පැත්තට අවුරුදු ගාණකින් කවුරුවත්ම ඇවිත් නැහැ."

"අහ්...මමත් මේ පහුගිය දවසක තමා ආවේ...  මෙහෙ වැඩිය කවුරුත් එන්නේ නැහැ තමා." ඔහුගේ හඬේ තිබුණු යමක් සඟවාගෙන කතාකරන ආකාරයක් අපිට දැනුණා.

පසුදින උදෑසන අපි සිව්දෙනා නැවතත් කැලයට යාමට පිටත්වුණා. යන අතරමගදීත් අපි ඒ අමුතු පුද්ගලයා ගැන කතාකරමිනුයි ගියේ.

"මේ කැලේ තනියම තරුණ කෙනෙක් ඉන්න එකේ සැකසහිත ගැටලුවක් පේනවා නේද?" මම ඇසුවා.

"ඒක තමා, එයාගේ කතා ශෛලියත් සැකසහිතයි." නියුමර් කීවා.

"ඔව්, එයා කතා කළේ මොනවහරි අපෙන් සඟවනවා වගේ..." මම කීවා.

"එයාගේ පරීක්ෂණය ගැන අහනවටවත් කැමති වුණේ නැහැ නේ..." ගිල්ක්‍රිස්ට් කීවා.

"මෙයා අපරාධයක් කරලා හැංගිලා ඉන්න අපරාධකාරයෙක් වෙන්නත් පුලුවන් නේ?" නිකොලායි කීවා.

"මෙතන මොකක්හරි වැරැද්දක් තියෙනවා..." නියුමර් කීවා.

"අපිට ආපසු යද්දීත් එතැන නවතින්න වෙනවා නේ. එතකොට අපි මේ ගැන හොයාගමු." අපි මේ ගැන හොයාගන්න එකගතාවයකට පැමිණියා.

අතිශය භයානක වන මෘගයන්, විෂ සහිත හා නාඳුනන ශාක වර්ග ඝනව වැවුණු තරණයට අපහසු පෙදෙස් පසුකරගෙන අපි දින තුනක් පුරා ඇවිද්දා. අවසානයේදී, පාෂාණ හමුවිය හැකියැයි අනුමාන කළ පෙදෙසට ලගාවීමට සැලකියයුතු දුරක් තිබියදී දොල පාරක් අසල තිබුණු එම පාෂාණ අපිට සොයාගන්න පුලුවන් වුණා. පාෂාණ රැගෙන යාහැකි ප්‍රමාණයක් එක්රැස් කරගෙන අපි ආපසු ඒමට පිටත් වුණා. ආපසු පිටත් වීමෙන් තෙවන දින සවස් වරුවේ අපි නැවතත් ඩේවිඩ් මෝල්ස්වර්ත්ගේ කඳවුරට ලගා වුණා.

මුල්වරට එතැනට ගොස් සතියකට ආසන්න වන නිසා, අපි එනවිට ඔහු එතනින් ගිහින් ඉදීවි කියලා සිතුවත් ඔහු එතැනම ඒ කදවුරේම සිටියා. ඔහු අපිව නැවතත් ඔහුගේ කදවුරට පිලිගත්තා. පසුදින උදෑසන නැවත පිටත් වීමට අපි නොසිතුවේ කාලගුණයේ පැවති තරමක අයහපත් තත්ත්වය නිසයි. දීර්ඝ ගමනකට පසු අතිශයින්ම වෙහෙසට පත්වෙලා සිටි නිසා වැඩි කතාබහකින් තොරවම අපි කූඩාරම් තුල නින්දට ගියා.
පසුදින උදෑසන අනික් අයට කලින් ඇහැරුණු මම ඩේවිඩ් මෝල්ස්වර්ත් සමග කතාබස් කරන්න පටන්ගත්තා.
"ඔයාලා හෙවූ පාෂාණ හමුවුණාද?"

"ඔව්, ඒවා තියෙනවා කියලා අනුමාන කරපු තැනටත් කලින් ඒවා අපිට හමුවුණා...දොල පාරක් අසලින්."

ඔහු තත්පර කිහිපයක් නිහඬව සිටියා. ඉන්පසුව ගස් අතරින් ඈතක් දෙස බලාගෙන මිමිණුම් හඬකින් මෙසේ කීවා. "සොබාදහම හරි පුදුම දෙයක්...සොබාදහම හැමෝවම මොනයම් හෝ ආකාරයකින් පුදුම කරනවා."

"ඇයි එහෙම කියන්නේ?"

"මට ඔයාලව විශ්වාස කරන්න පුලුවන් ද?" ඔහු එය ඇසුවේ විනාඩියක පමණ දැඩි නිහඬතාවයකට පසුව.

"ඩේවිඩ් මහත්මයා, මට කියන දෙය පැහැදිලි මදි." ඔහුගේ අමුතු ප්‍රශ්නය නිසා අපහසුතාවයට පත් වුණ මම ඇසුවා.

"එන්න මාත් එක්ක." ඔහු මාව රැගෙන ගියේ කඳවුර තිබුණු තැනින් තරමක් එහා තිබුණු කුඩා තැනිතලා කොටසක් වෙතයි. එතැන වූ කොටයක හිදගත් ඔහුට පසෙකින් මමත් හිදගත්තා.

එවිටම අපව සොයමින් අනෙක් තිදෙනාත් එතනට පැමිණියා. ඒ බව නොතකමින් ඩේවිඩ් මෝල්ස්වර්ත් ඔහුගේ කතාව කියන්න පටන් ගත්තා.

"මගේ දිග කතාව මම කියන්නම්. හැබැයි ඔයාලා ඒක විශ්වාස කරාවි කියලනම් මට හිතෙන්නේ නැහැ. මේක වෙන්න බැරි දෙයක් කියලා පෙනුනට ඒ තමා ඇත්ත. මම මෙතන හිටපු දශක ගණනාවටම මෙතැනට ආව එකම කණ්ඩායම ඔයාලා. ඒ නිසාම

ඔයාලා හැර වෙන කවුරුත් මේ කතාව දන්නේ නැහැ. සොබාදහම හරි පුදුම දෙයක් කියලා මම කියුවේ සොබාදහම ඔයාලව හරි වෙලාවටම මෙතනට එවලා මාව මගේ දීර්ඝ ජීවිතයේ අන්තිම වතාවටත් පුදුම කළ නිසයි."
ඔහු දිගු සුසුමක් හෙලුවා.

"මම කැමති නෑ මගේ මේ රහස මගෙත් එක්කම නැතිවෙලා යනවට. තව මට ඉතුරු වෙලා තියෙන්නේ පැය 24ක් විතරයි."
ඔහු ඈත යමක් දෙස විනාඩියක් පමණ නිහඬව බලාගෙන සිටියා. ඔහු කියූ දෙය අපැහැදිලි වුණත් ඒ පිළිබඳ යමක් අසන්නටවත් නොහැකි තරමට අපි සියලු දෙනාම පුදුමයටත්, වික්ෂිප්තතාවයටත් පත්ව සිටියා.

මේ අතරතුර ඉහල මාලයේ සිටි විද්‍යාගාර සහයකයන් තිදෙනා අතර රහසිගත සාකච්ඡාවක් සිදුවෙමින් තිබුණි.

"මම මේ වැඩේට සම්පූර්ණයෙන්ම විරුද්ධයි." කේට් කීවාය.

"ඒත්, මේකට අපිට ඔයාගේ උදව් ඕන." සෙසු දෙදෙනා කීහ.

"අපි කොහොමද ඒක කරන්නේ? තුන්දෙනෙක්ට කොහොමත් බෑ." කේට් නැවතත් මිමිණුම් හඬින් කීවාය.

"බෑ කියලා හරියන්නේ නැහැ කේට්. අපි මේ දේ වෙනුවෙන් අවුරුදු ගාණක් කැප කළා." රොනල්ඩ් කීවේය.

"හරි, මේ දේ කරලා අපිට ඉස්සරහටත් විද්‍යාගයින් විදිහට වැඩ කරන්න පුලුවන් වෙයි කියලා ඔයා හිතනවද?" කේට් ඇසුවාය.

"ඒත් කේට්.... අහන්න, ඔයතරම්ම ආත්මාර්ථකාමී වෙන්න එපා." සාෂ්කා කීවේය.

"හරි මොකක්ද දැන් වැඩපිළිවෙළ?"

## අමරණීයයකුගේ මරණය

# Chapter 2

"මම මුලින්ම මෙහෙට ආවේ මීට අවුරුදු එකසිය විස්සකට කලින්. ඒ කියන්නේ 1871දී. හෙටට මට හරියටම අවුරුදු 153යි." ඩේවිඩ් මෝල්ස්වර්ත් කියාගෙන ගියා. ඔහු ඒ කියවන්නේ මොන හරුපයක්ද කියලා අපිට හිතුණා. සමහරවිට කාලයක් කැලේටම වෙලා ඉදලා ඔලුව අවුල් වුණු කෙනෙක් වෙන්නඇති කියලා මට හිතුණා.

මෝල්ස්වර්ත් දිගටම කතාව කියන්නට වුණා.
"1871 දී මම ඇමසන්වලට ආවේ විශේෂ පැළෑටියක් හොයාගන්න. මාත් එක්ක තව පස් දෙනෙක් හිටියා. අපි රාත්‍රියට කූඩාරම් ගසාගන්න තැනක් හොයාගෙන ඔයාලා වගේම මෙතැනට ආවා. ඒ එනකොට මෙතන පුංචි කූඩාරමක් තිබුණා. ඒකේ හිටියේ වයස අවුරුදු 50ක විතර ජෝන් බැනිස්ටර් කියලා මහත්මයෙක්. ඔහුගේ කූඩාරම අසලින් කූඩාරමක් ගසාගෙන රාත්‍රිය ගතකළ අපි පහුවෙනිදා උදේම ආයෙත් කැලෑවට පිටත් වුණා. සතියකට විතර පස්සේ පැළෑටිත් හොයාගෙන ආපහු එන අතරමගදී අපි නැවතත් මෙතැනටම පැමිණියා. ඒත් දහවල් වෙලාවක් නිසා තවත් දුර යාගන්න පුලුවන් නිසා අපි මෙතන කූඩාරම් නොගසා දිගටම ඇවිද්දා.
මෙතන පසුකරලා වැඩි දුරක් යන්න ලැබුණේ නැහැ. අතරමගදී දිලිසෙන නිල්පැහැ කුරුමිණියෙක් මට දෂ්ට කළා. ඊටපස්සේ මට සිහිය එනකොට මම හිටියේ බැනිස්ටර් මහතාගේ පුංචි කූඩාරමේ. ඒ වෙනකොටත් ඌ මට දෂ්ට කරලා සති දෙකක් ගතවෙලා

තිබුණා. ඔහු මගේ සගයන්වත් නැවත පිටත් කරලා තිබුණා. ඔහු ඒ කල දෙයින් මට තනියම මේ ඝන කැලයක යන්න වෙන බව කිය කියා මම ඔහුට හොඳටම දොස් කියුවා. ඒත් ඒ සේරම සාවදානයෙන් අහගෙන හිටිය ඔහු අන්තිමේදී මෙහෙම ඇහුවා. "ඔයාට සිහි නැතිවෙන්න කලින් මොකක්ද වුණේ කියලා මතකද?"
මාව ප්‍රශ්නයක පටලලා මට වුණේ මොකක්ද කියලා ඔහු අහනකොට මට තව තවත් කේන්ති ගියා.
"කුරුමිණියෙක් මට විද්දා." තරහින්ම මම කියුවා.

"මොන වගේ කුරුමිණියෙක් ද? නිල් පාට දිලිසෙන එකෙක්ද?" ඔහු ඇසුවා.

"ඔව්, ඔව්, ඒත් දැන් ඒකෙන් වැඩක් නැනේ. මම මේ කැලේ ඇතුලේ හිරවෙලා." මම කෑගහගෙන කූඩාරමෙන් එලියට ඇවිත් අර පහල ජේන දියපාර ලගට ගියා."
ඔහු තැනිතලාවට මදක් එහා ගස් අතරින් ජේන කුඩා දියපාරක් පෙන්වමින් කියුවා.

"එතනට ගිය මම කල්පනා කලේ කොහොමද මේ කැලෙන් එලියට යාගන්නේ කියලා. ඊට ටික වෙලාවකට පස්සේ බැනිස්ටර් මම හිටපු තැනට ආවා. "ඔයාගේ තරහ නිමිලා නම් මම කියන එක අහනවාද?" ඔහු කාරුණිකව ඇසුවා."

මෝල්ස්වර්ත් දිගු සුසුමක් හෙලා නැවත්ත කතාව පටන් ගත්තා.
ඔහු මම හිටි තැනට ඇවිත් මගේ පසෙකින් වාඩිවුණා. ඔහු සාක්කුවෙන් පිහියක් ඇදලා ගත්තා. ඊටපස්සේ එකපාරටම මගේ

අත ඇදලා අරන් පිහියෙන් කැපුවා. මම කෑගහගෙනම ඔහුවත් තල්ලු කරලා නැගිට්ටා. ඒත් මගේ අත කැපිලා තිබුණේ නැහැ. පිහිය අත උඩින් තදින් ඇදිලා යනවා මට දැනුනත් එතන කැපුමක් හෝ සීරුමක්වත් නැහැ. මම පුදුමයෙන් බැනිස්ටර් දෙස බැලුවා.

"දැන් කලබල නැතුව වාඩිවෙන්න. මට පෙන්නන්න ඕන වුණේ ඔබ ඇසිය යුතු දෙයක් මා ලග තියෙනවා කියලයි." ඔහු කීවා.

"ඔබ මාව මරන්නද යන්නේ?"

"කිසිසේත්ම නැහැ. මට ඔබව මරන්න ඕන නැහැ."

"මොකක්ද ඔයතරම්ම මට කියන්න තියෙන දේ?"

"ඔබ අමරණීයයි. ඒවගේම මමත්."

"ආහ්, මොන විකාර විහිලුවක්ද?"

"විහිලුවක් නෙවෙයි. ඒක මම ඔබට ඔප්පු කර පෙන්නුවා."

"මොට්ට පිහියකින් මාව නොකැපුණ එකද ඔප්පු කිරීම? හහ්?? ඔබට මාව විහිලුවක් වගේද??"

"ඔබට මාව විශ්වාස නැත්නම් ඔබම ඔබට යමකින් තුවාලයක් කරගන්න උත්සාහ කරන්න. එතකොට ඔබටම තේරේවි."

"ඔබ මගේ ජීවිතයත් එක්ක සෙල්ලම් කරන්නේ බැනිස්ටර් මහතා..."

"නැහැ. මම කියන දේ ඔබට වැටහේවි ඔබම අත්හදා බැලුවොත්." තරහින් වියරු වෙලා හිටි මම ලගම තිබුණු විශාල ගලක් ඔසවා මගේ කකුලක් උඩට අතඇරියා. සාමාන්‍යයෙන් නම් ඒ තරම් ලොකු ගලක් කකුලට වැටුනොත් කකුල ගැලවිලා යන තරම් වේදනාවක් දැනෙන්න ඕන වුණත් පුදුමයකට තුවාලයක් තබා අවම වශයෙන් රිදීමක්වත් මට ඇතිවුණේ නැහැ.

"ජේනවා නේද?" බැනිස්ටර් ඇසුවා.

මගේ කෝපය පසෙකලා මම බැනිස්ටර් මහතා කියන දේට සවන්දුන්නේ ඉන්පසුවයි." මෝලස්වර්ත් එකදිගටම කියාගෙන ගියා.

"ඒත්, දැන් ඔබ කියුවේ ඔබ අමරණීයයි කියලා?" ඊට බාධා කරමින් නියුමර් ප්‍රශ්න කළා.

"ඔව්, ඒකට අමරණීයත්වයක් කියලා කියන්න පුලුවන්."
"බැනිස්ටර් මහතා ඊට අවුරුදු 90කට කලින් ඇමසන්වලට ආව කෙනෙක්. ඒ කියන්නේ 1781 අවුරුද්දේ විතර. ඒ ඔහු ඇමසන් වනයට ආව පලවෙනි වතාවත් නෙවෙයි. නමුත්, එදා අනපේක්ෂිතව ඔහුටත් මට දෂ්ඨ කළ කුරුමිණියෙක්ම දෂ්ඨ කරලා තිබුණා. ඔහු කෘමීන් පිලිබඳව අතිවිශාල දැනුමක් තියෙන

කෙනෙක්. ඒත් ඒ කුරුමිණියා මොකාද කියලා ඔහුටත් හිතාගන්න බැරිවුණා.
නමුත්, අවුරුදු ගාණක් මහන්සිවෙලා ඒ විශේෂය ගැන සදහන් වෙන සියවස් ගණනාවකට පෙර ලියැවුණු පැරණි ඉන්දියානු වෛද්‍ය පුස්තකයක් හොයාගන්න ඔහුට පුලුවන් වුණා. වැඩි විස්තරයක් නොතිබුණත් එම විශේෂයේ කුරුමිණියන් එරට හිමාලය වනයේත් දැකගන්න ලැබෙන බව එහි ලියවිලා තිබුණා. ඔවුන් එම කෘමීන් සියලු රෝග සමනය කරන ඔසුවක් විදියට භාවිතා කරන බවත් ඒකේ තිබුණා. ඔහු ඒ පුස්කොළ පොත හොයාගෙන තිබුණේ ඇමරිකාවේ ග්‍රාමීය ප්‍රදේශයක හිටිය දේශීය වෛද්‍යවරයෙකුගෙන්. බැනිස්ටර් මහතා ඒ කෘමියාව 'i2' හෙවත් 'Imortalizing Insect' කියලා නම් කරලා තිබුණා. මමත් ඔහු ඒ හොයාගත්ත පුස්කොළ පොත කියෙව්වා.

ඒකේ තිබුණා දෂ්ය කිරීමකට ලක්වුණු කෙනෙක් ජීවත් වුණු කාලයට අමතරව තව අවුරුදු 120ක් ජීවත් වන බව. ඒ වගේම කිසිම විෂ ද්‍රව්‍යයකින්, තුවාල කිරීමකින් මරණයට පත් කරන්න බැරි බවත්, අමරණීය අවුරුදු 120ක ජීවිත කාලය අවසන් වූ සැනින් ඒ පුද්ගලයා වාෂ්ප වී ගොස් එසැණින් නව ජීවිතයකට ඇතුල් වන බවත් එහි තිබුණා. ඒ වගේම එම කෘමීන් අතිශයින්ම දුර්ලභ බවත් එහි කියැවුණා. එම සතාගෙන් ලබා ගන්නා විෂ පානය කර ඇත්තේ එකල හිමාලයේ වනවාසීව විසූ බ්‍රාහ්මණයින් පමණක් වූ බවත්, අඩු කුලයක අයෙක් එය බිවූ සැනින් පිච්චී විනාශවී යන බවත් එහි කියැවුණා.ඔහු ඒ පුස්තකය හොයාගත්තාට පස්සේ ඉන්දියාවේ හිමාල ප්‍රදේශයට ගිහින් එහෙ ඉන්න බ්‍රාහ්මණයින් ගෙන් තොරතුරු විමසලා තිබුණා. නමුත්, ඔවුන් එවැනි කෘමියෙක් ගැන දැනගෙන ඉදලා නැහැ.”

"බැනිස්ටර් මහතා කොහොමද දන්නේ ඒ කුරුමිණියා දෂ්ඨ කළ නිසා තමන් අමරණීය වුණා කියලා?" මම ඇසුවා.

" කුරුමිණියා දෂ්ඨ කළ දවසේ ඉඳලා තමන්ට වෙනසක් දැනුනත්, තමන් අමරණීය බව මුලින් ඔහු දැනන් හිටියේ නැහැ. තමන්ගේ වයස කොපමණ ගතවුණත් තමන්ගේ පෙනුම වෙනස් වෙන්නේ නැති නිසාත්, ලෙඩක්වත්, තුවාලයක්වත් වෙන්නේ නැති නිසාත්, මරණයට පත් වෙන්නෙත් නැති වුණාම තමයි ඔහුට එතන යම් වරදක් වෙලා තියෙන බව තේරිලා තියෙන්නේ. මේ සතාගේ විෂ ටික අරගන්න බැනිස්ටර් මහතා හුග කාලයක් තිස්සේ උත්සාහ කරලා තිබුණා. පසුව මමත් ඔහුගේ පරීක්ෂණ වලට උදව් වුණා. බැනිස්ටර් මහතාගේ අදහස වුණේ මේ විෂ අඩු සාන්ද්‍රණයකින් ලබාදීමෙන් සියලු ලෙඩ රෝග සුව කරගන්න පුලුවන් වෙයි කියලා. නමුත්, ඒකට අපිට i2 කෘමියන් අවශ්‍යයි. ප්‍රශ්නය තියෙන්නෙත් එතැන. අපි හැමදාම මේ අවට සහ ඇමසන්වල විවිධ ස්ථානවල මේ කුරුමිණියන් හෙව්වා. ඒ අවුරුදු ගණනාවටම අපිට හොයාගන්න පුලුවන් වුණේ කුරුමිණියන් දෙන්නෙක් විතරයි. මුලින්ම සොයාගත් එකාව අල්ලලා බෝතලයකට දාන්න යනකොට උගේ දලය කැඩුණා. එසැනින්ම ඌ දියවෙලා ගියා. අපිට ඒකට හේතුවක් හොයාගන්න බැරිවුණා. අපි කවදාවත් නොහිතන විදියේ ජීවීන් මේ ලෝකේ ඉන්නවා කියලා ඒකෙන් ඔප්පු වෙනවා නේද?" ඔහු මදකට කතාව නවත්වමින් ඇසුවා.

ඒත් ඒකට දෙන්න උත්තරයක් අපිට ඒ වෙලාවේ තිබුණේ නැහැ. ඒ නිසා ඔහු ආයෙත් කතාවට බැස්සා.

"ඉන්පස්සේ හම්බවුණ කුරුමිණියා කොහොම හරි පරිස්සමෙන් බෝතලයකට දාගන්න අපිට පුලුවන් වුණා. ඉන්පස්සේ ඌට හානියක් නොවෙන විදිහට අපි ඌගේ විෂ සිරින්ජරයකට ඇදලා ගත්තා. ඒක තද නිල් පාට ද්‍රාවණයක්. අපි ඒ විෂ කුප්පිය අරගෙන ගියා විද්‍යාගාරයකට. ඒකේදී අපි පරීක්ෂණ කරලා බැලුවා. එහි අන්වීක්ෂීය පෙනුම වෛරසයක පෙනුමක් ගත්තා. පස්සේ තවත් පරීක්ෂණ කරගෙන යනකොට තේරුණා ඒක සාමාන්‍ය විෂ සංයෝගයක් වගේ නෙවෙන බව. ඒක වෛරස් එකක් බව.
ඉන්පස්සේ අපි අපේ ලේ සාම්පලයක් අරගෙන බැලුවා. ඒක අරගන්නත් ගොඩක් අමාරු වුණා. මොකද සුලු තුවාලයක් වත් සිද්ධවෙන්නේ නැති නිසා. පැය කිහිපයක් මහන්සි වෙලා ගත්ත මගේ ලේ සාම්පලයත් තද නිල් පාටින් තියෙනවා දැක්කම අපි පුදුම වුණා. සාමාන්‍යයෙන් රුධිරයේ අඩංගු කිසිම දෙයක් ඒකේ තිබුණේ නැහැ. ඒක සම්පූර්ණයෙන්ම කුරුමිණියාගෙන් ගත්ත විෂවලට සමාන වුණා. මේ සොයාගැනීම්වල අගක් මුලක් අපිට හිතාගන්න බැරිවුණා. පිටින් පේනවාට වැඩිය ප්‍රශ්නය ගොඩක් සංකීර්ණ එකක්.

ඒ අතරතුර දැනට අවුරුදු හතලිහකට කලින් අපි මේ කූඩාරම් ඇතුලතම පරීක්ෂණ කටයුතු කරමින් ඉන්න අතරතුර බැනිස්ටර් මහතා එක්වරම කියුවා ඔහුගේ ඇග රිදෙන බවක්. මොනදේ කලත් ඔහුට සුවයක් ලැබුණේ නැහැ. ඔහු කෙදිරිගාමින්ම කියුවා ඔහුට කුරුමිණියා දෂ්ඨ කරලා අදට හරියටම අවුරුදු 120ක් කියලා. මට ඊට වඩා දෙයක් ඔහුගෙන අහගන්න බැරිවුණා. තත්පර කිහිපයක් ඇතුලත ඔහු සම්පූර්ණයෙන්ම නිල් පාට වාෂ්පයක් බවට පත්වුණා. එදා ඉදලා මම තනිවම මේ කූඩාරමේ ඉදලා පරීක්ෂණ කටයුතු කරගෙන යනවා."

"මහත්මයා, ඔබ කියුවා නේද තව පැය 24ක් විතරයි ඔබට තියෙන්නේ කියලා?" මම ඇසුවා.
"ඔව්, මටත් කුරුමිණියා දෂ්ඨ කරලා හෙටට හරියටම අවුරුදු 120ක් වෙනවා. මගේ මුලු ජීවිත කාලෙටම ඇමසන්වල මෙතරම් දුරක් නිරුපද්‍රිතව ආව එකම කණ්ඩායම ඔයාලා. සමහර අය ගඟෙන් මෙහාට ආවට පණපිටින් ආපහු යන්නේ නැහැ. ඔයාලා ආවේ හරිම වෙලාවේ. නැත්තම් මේ රහස මාත් එක්කම වාෂ්ප වෙලා යනවා."

"අපි ඔය කියනවා වගේ නිල් පාට කැරපොත්තෙක් වගේ කුරුමිණියෙක්ව දැක්කා. අපි මෙහෙට එනකොට අතරමගදී, මේ ළඟම." ගිල්ක්‍රිස්ට් කීවා.

ඔහු එය කියනකම්ම මට මගේ කකුල උඩින් ඇවිද ගිය ඒ සතාව අමතක වෙලයි තිබුණේ. "ඔව්,ඔව්, ඌ මගේ සපත්තුව උඩින් ගියා."

"දිලිසෙන නිල් පාටක් තියෙන පිටකට්ටක් තියෙන එකෙක්ද?"

"ඔව්, ඔව්.."

"ඌ දෂ්ඨ කළේ නැහැ නේ?"

"නැහැ."

"ඒක හොඳයි." ඔහු සුසුමක් හෙලමින් කියුවා. “ඔයාලා දැකලා තියෙන්නේ ඒ සතාව තමා.”

"අපේ කණ්ඩායම ලෑස්තිද?" රොනල්ඩ් ඇසුවේය.

"ඔව්, එයාලා පිටත සූදානම්ව ඉන්නවා. කීයටද අපි වැඩේ පටන් ගන්නේ?"

"හරියටම තව විනාඩි දහයකින්, රොනල්ඩ්."

"හරි, දැන් වැඩේ වෙන විදිහ පැහැදිලිව කියන්න." කේට් කීවාය.

"මෙහෙමයි. මුලින්ම, එලියේ ඉන්න අපේ කණ්ඩායම ඇවිත් ඉන්න ප්‍රධාන විද්‍යාගයින්ගේ සංගමයේ අය විද්‍යාගාරය ඇතුලට කොටු කරගන්නවා. පිටතින් කාටවත් ඇතුල්වෙන්න බැරි වෙන විදියට හැම ඇතුල්වීමකම ආරක්ෂාව තර කරනවා. ඒ අතර දැනට ඇතුලට ඇවිත් ඉන්න අපේ කණ්ඩායමේ අය ඉහල තට්ටුවේ ඉන්න අයව ගෙනියලා ආරක්ෂක කුටීරයේ පිටවෙන්න බැරි වෙන්න වසා දමනවා."

"ඔයා හිතනවාද සාෂ්කා වැඩේ හරියයි කියලා?" කේට් සැකයෙන් ඇසුවාය.

"ඔව්, අපේ කට්ටිය හැමඅතින්ම ආයුධ සන්නද්ධව ඉන්නේ. මම හිතන්නේ නැහැ වැඩේ අතරමගදී වැරදෙයි කියලා."

"හරි, හරි, ඉතුරු ටිකත් කියන්නකෝ."

"ඊටපස්සේ, අපි තුන්දෙනයි, කණ්ඩායමේ තව අටදෙනෙකුයි පහල තට්ටුවේ සාකච්ඡාව වෙන තැනට යනවා. ඊටපස්සේ ප්‍රධාන තුන්කට්ටුව බැදලා දාලා අපේ මහාචාර්යතුමන්ලා දෙන්නවයි, කුප්පියයි අරගෙන එනවා."

"ඒත්, ඔක්කොටම කලින් විද්‍යාගාරයේ පාලනය අපි අතට ගන්න වෙනවා නේද?" කේට් ඇසුවාය.

"ඔව්, ඒකට දැනටම කට්ටියක් යවලා ඉන්නේ. එයාලා අවශ්‍ය වෙලාවට වැඩේ කරාවි."

## අමරණීයයකුගේ මරණය

# Chapter 3

මහාචාර්යවරු දෙපලත්, ප්‍රධාන විද්‍යාඥයින් තිදෙනාත් නොදන්නා යමක් ඔවුන්ට ඉහල මහලේ සිදුවෙමින් පැවතුණි. ඉහල මහලේ සිටි සංගමයේ පිරිසට යමක් පෙන්වීමට ඇති නියයෙන් ආරක්ෂක කුටීරයට ගෙනයාමට රොනල්ඩ් සමත් විය.

හොඳින් වායුසමීකරණයට ලක්කරන ලද එම කුටියේ පුටු පේලි කිහිපයක් තබා තිබුණේ සිතාමතාමය. ඔවුන්ගේ රාජකාරිය අවසන් වන තුරු පැය කිහිපයකට ඔවුන්ව කුටියේ සිරකර තබා ගැනීම ඔවුන්ගේ අරමුණ විය. ඒ අතරතුර ආයුධ සන්නද්ධ විශාල පිරිසක් විද්‍යාගාරයට ඇතුලු විය. ආරක්ෂක නිලධාරීන්ව තම යටතට ගත් ඔවුන් සෙසු විද්‍යාගාර සේවකයින් සහ සහකාර විද්‍යාඥයින්ද බියගන්වා එක් කුටියකට දමා අගුලු දැමූහ. තමතමන්ට පැවරුණු කටයුතු හොඳින් සිදුවී ඇති බවට සැකහැර දැනගත් ඔවුහු තම ඊළඟ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා සාෂ්කා සොයා ගියහ.

"පහලින් තියෙන රසායනාගාරයට තමා අපි යන්න ඕන. එන්න අපිත් එක්ක." සාෂ්කා තමා වෙත පැමිණි ආයුධ සන්නද්ධ පිරිසට පැවසුවේය.

ඔවුන් සමග රොනල්ඩ් සහ කේට් ද පැමිණියහ. ඉදිරියෙන් ගිය සාෂ්කා අනුගමනය කරමින් පිරිස ඇතුලුවූයේ බිංගෙයක් වැනි අඳුරු කොරිඩෝවකටය. කොරිඩෝව කෙලවර දොරකි. සාෂ්කා

බරැති ලෝහයකින් තැනූ විශාල යතුරක් දොරට පසෙකින් බිත්තියේ සවිකර තිබුණු පෙට්ටියෙන් පිටතට ගත්තේය.

෴ ෴ ෴

එදා මුලු දවසම ඔහු අපිත් එක්ක කතා කර කර හිටියා. ඔහු කතාකරන ශෛලියේ යම් ගුප්තබවක් තියෙනවා කියලා හැගුණත් අපි ඔහු කියපු හැමදෙයක්ම යම්තාක් දුරකට හෝ ඒ වෙලාවේ පිළිගත්තා. ටික ටික රෑ වෙනකොට මෝල්ස්වර්ත් මහතාගේ ඇගේ වේදනාව වැඩිවෙනවා කියලා අපිට තේරුණා. ඒත් ඔහු ඒක ආයාසයෙන් ඉවසාගෙන හිටියා. අපි රාත්‍රියේ නින්දට ගියෙත් ඔහුට මොනවා වෙයිද කියලා හිතමින්. රාත්‍රිය පුරාම මෝල්ස්වර්ත්  මහතාගේ කූඩාරමින් කෙදිරිගාන ශබ්දය අපිට ඇහුණා. ඔහුගේ ශාපලත් ජීවිතය ගැන අපි හුගක් දුක්වුණා. රාත්‍රි දොලහට පමණ ඔහු ඔහුගේ කූඩාරම ඇතුලේ ඉදන් වේදනාවෙන් කතාකරන ශබ්දය අපිට ඇහුණා.

"ඔ...ඔයාලට මාව...ව ඇහෙ...නවාද?" ඔහු අමාරුවෙන් ඇසුවා.

"ඔව්, අපිට ඔබව ඇහෙනවා. ඔබට මොනවාහරි අවශ්‍යද?"

ඔහුගේ වේදනාවට අපිට කලහැකි කිසිවක් නැති බව අපි දැනසිටියා. ඔහුගේ කීමට අපි ඔහුට තනිවම රාත්‍රිය කූඩාරමේ ගතකරන්න ඉඩදුන්නා. ඔහු කියූ විදියට ඔහුගේ අවසාන විනාඩි කිහිපයේදී අපට අහිතකර විය හැකි කිරණ පිටවිය හැකි නිසා අපි ඔහුව තනිකර දමා සිටිය යුතු වුණා.

"ඔයාලා නොහිතන දෙයක් හෙට මගේ කූඩාරමෙන් ඔයාලට හමුවේවි. ඔයාලගේ ජීවිතය පවතින් තුරාවට මේ ගැන සෙවීම

අතහැරලා දමන්නේ නැහැ කියලා මට පොරොන්දු වෙන්න...!" ඔහු වේදනාව යටපත් කරගෙන එක හුස්මට වේගයෙන් කියාගෙන ගියා.

අපි කිසිවක් නොහිතාම ඔහුට පොරොන්දු වුණා.
"අපි පොරොන්දු වෙන්නම්! සදහටම....ජීවිත කාලය පුරාවටම..."

තවත් පැයක පමණ කාලයක් ඔහුගේ කෙදිරිල්ල අපිට ඇහුණත් එක්වරම එය නැවතුණා. ඔහුගේ කූඩාරමට ගොස් සිද්දවූයේ කුමක්දැයි බලන්න සිතුණත් ගණ කලුවර හේතුවෙන් අපි ඒ අදහස අතහැර දැමුවා. කෙසේවෙතත්, අපිට මධ්‍යම රාත්‍රිය පසුවන විට නින්ද ගොස් තිබුණා.

අපි උදෑසන අවදිවන විට අපත් සමග සිටි නිකොලායි කූඩාරම තුල සිටියේ නැහැ. නමුත්, ඔහු සොයන්නට කලින් අපි ඉක්මනින් මෝල්ස්වර්ත් මහතාගේ කූඩාරම විවෘත කර බැලුවා. ඔහු ඒ තුල සිටියේ නැහැ. නිසැකවම ඔහු කියුවා වගේම ඔහුව වාෂ්ප වී යන්නට ඇතැයි අපි සිතුවා. ඔහුගේ කූඩාරම තුල මෙම අද්භූත කුරුම්ණියා ගැන ඔහුත්, බැනිස්ටර් මහතාත් කල පරීක්ෂණ ලියැවුණු කොළ, තවත් පැරණි ග්‍රන්ථ, අතිශයින්ම පැරණි පුස්කොළ පොතක කොළ කිහිපයක් අපි සොයාගත්තා.

පුස්කොළ පොතට මදක් එහා දුහුවිල්ල මත ඇවිදිමින් සිටි කෘමියා දුටු අපි විශ්මයට පත්වුණා. ඒ ආකර්ෂණීය නිල් පැහැයකින් යුත් කුඩා කෘමියෙක්. එහි පැමිණි මුල් දින මගේ සපත්තු උඩින් ගිය කුරුම්ණියාට හාත්පසින්ම සමාන කුරුම්ණියෙක්! ඒ I2 කෘමියාම බව අපි අඳුරාගත්තා. ඌ කූඩාරම ඇතුලට ආවේ කොහොමද

කියලා අපිට හිතාගන්න බැරිවුණා. ඌව ඉක්මනින්ම නිරුපද්‍රිතව බෝතලයක් ඇතුලට දමාගන්න අපිට පුලුවන් වුණා. ඌ පිළිබඳව තර්ක කර අවසානයේ මමත්, නියුමර්ත්, ගිල්ක්‍රිස්ට්ත් අවසාන එකගතාවයකට පැමිණියේ මෝල්ස්වර්ත් මහතා වාෂ්ප වී එසැනින් I2 කෘමියෙක් බවට පත් වූ බව පිලිගනිමින්. මන්ද, මෝල්ස්වර්ත් මහතා කලින් දවසේ අපත් සමග කතාකරන අතරතුර මෙම කෘමි දෂ්ටනයට ලක්ව වසර 120ක් ආයු වලදා අවසානයේ වාෂ්පව යන තැනැත්තා එසැනින් නව ජීවයක් ලබන්නේ'යැයි පුරාණ පොතක සදහන් වූ බව ඔහු කියූ නිසා.

කුරුමිණියා සහිත බෝතලයත්, පරීක්ෂණ ලියවිලි, පුස්කොළ පොත ඇතුළුව මෝල්ස්වර්ත් මහතාගේ කූඩාරමේ තිබුණු වැදගත් යයි හැගෙන දෑ අපේ ගමන් මලුවලට හැකිපමණ දමාගෙන පිටත්ව යාම සදහා අපගේ බඩුබාහිරාදිය සූදානම් කරගත්තා. ඒවනතෙක්ම නිකොලායි පැමිණියේ නැති නිසා අපි ඔහුව සොයන්න ගියා. එදින උදෑසනම කදවුරෙන් පිටවෙන්න තීරණය කරලා තිබුණත් කිසිම හෝඩුවාවක් නැතුව නිකොලායි අතුරුදන් වෙලා තිබුණා. එදා මුලු දවසම කදවුර අවට ප්‍රදේශයේ අපි ඔහුව හෙව්වා. රාත්‍රියේ නැවත කූඩාරම්වලම නැවතිලා ඔහු පැමිණේදැයි බලා සිටියා.

ඔහු ගිය තැනක් සොයාගන්න බැරිවුණ නිසා අපි තුන්දෙනා පසුවදා කදවුර අතහැරදාලා ආවා. ඉන්පස්සේ අපි අර කුරුමිණියා ගැන අධ්‍යයනය කරමින් මේ ඖෂධය හදන්න අපේ මුලු ජීවිත කාලයම කැපකළා. අවසානයේ මේ තමා අපි සොයාගත් දේ." ලුවිස් තමා ඉදිරියේ මේසය මත වූ කුඩා කුප්පිය දක්වමින් කීවේය.

ඔහු එය කියා නිම කරත්ම ඔවුන් හිඳසිටි මේසයට ඉදිරියෙන් රසායනාගාරය කෙලවරේ ඇති භූගත මාර්ගයකට සම්බන්ධ කේත දොරටුව විවර විය. මහාචාර්යවරු දෙපල විමතියෙන් මුහුණින් මුහුණ බලාගත්තේ මේ වෙලාවේ එය සිදුවිය නොහැක්කක් වූ නිසාය. ප්‍රධාන විද්‍යාඥයින් තිදෙනාද ඔවුන්ගේ අතිශයින්ම රහසිගත සාකච්ඡාවක් අතරතුර සිදුවූ මේ හදිසි පැමිණීමෙන් විස්මයට පත්වූහ. විවර වූ දොරින් ඇතුලට ආ රැවීමකින් යුත් සාෂ්කා දැකීමෙන් මහාචාර්ය ලුවිස්ට දැණුනේ තම ශරීරාභ්‍යන්තරයේ සීතල ගිනිමැළයක් ගසා ඇතිවාක් මෙනි.

"ඔබතුමන්ලා කලබල කරන්න එපා. හෙමීට ඔය මේසෙන් අනික් පැත්තට යන්න." සාෂ්කා උස් හඬින් කීවේය.

"සාෂ්කා..! මොකක්ද මෙතන වෙන්නේ?" මහාචාර්ය ලුයිස් විශ්මයෙන් ඇසුවේය.

"ඒක ගැන අපි තව ටිකකින් කතකරමු." රළු හඬින් පිලිතුරු දුන් සාෂ්කා තමාට පිටුපසින් සිටි රොනල්ඩ්ට සංඥාවක් දුන්නේය. ඔහු වහා ක්‍රියාත්මක වී මේසය මත වූ ඖෂධ කුප්පිය ගෙන ආරක්ෂක කේතයක් සහිත කුඩා ලොකරයක දමා අගුලු දැම්මේය.

" මහාචාර්ය කැමී..." සාෂ්කා කීවේය. "ඔයාලට අපි යන්න දෙනවා. ඔයාලට කරදරයක් කරන්න බලාපොරොත්තුවක් නැහැ. ඒත්, මේ සිද්ධිය මොනයම් හෝ විදියකින් සමාජ මාධ්‍යයට හරි ආරක්ෂක අංශවලට හරි ආරංචි වුණොත් අපිට මීට වඩා දරුණු

වෙන්න සිද්ධ වෙනවා." සාෂ්කා දරුණු ස්වරයකින් කීවේය. ඔහුගේ මේ අද්භූත බව දැක රොනල්ඩ් සහ කේට් පුදුම වූහ.

සාෂ්කාගේ සංඥාවකට අනුව ආයුධ සන්නද්ධ පිරිසෙන් අයෙක් විශාල ට්‍රන්ක පෙට්ටියක් රැගෙන විත් එය මහාචාර්ය කැමීට ලබාදුන්නේය.

"ඔතන ඩොලර් මිලියන 80ක චෙක්පත් තියෙනවා. මගේ සේවාදායකයාගෙන් අත්තිවාරමක් විදිහට..."
එතෙක් වේලා ප්‍රධාන විද්‍යාඥයින් තිදෙනාගේ මුහුණුවල පැවති අමනාප සවරූපය එය ඇසීමෙන් ක්ෂණයකින් විශ්මය මුසු කැදර බැල්මකට මාරුවිය.

"සාෂ්කා, මොකක්ද ඔයා මේ කරන්නේ? " මහාචාර්ය නියුමර් වෙව්ලන හඩකින් ඇසුවේය. "අපි මේ ඖෂධය හොයාගන්න කොයිතරම් මහන්සි වුණාද කියලා ඔයාලා දන්නවා නේ? අපි ඔයාලව විශ්වාස කළා." ඔහු කීවේ තම තරුණ විද්‍යාගාර සහයකයන් තිදෙනාටය.

"ඔව්, අපිත් ඔයාලව විශ්වාස කළා. මගේ සීයායි, ඔයාලයි ගැන ඇත්ත විස්තරය මම හොයාගන්නකම්" සාෂ්කා කාමරය දෙදරා යන හඩකින් කීවේය.

"සීයා...නිකොලායි?"

"ඔව්, නිකොලායි. ඔයාලා එයාට කලේ ලොකු වංචාවක්. ඔයාලා මගේ අසරණ සීයාව රැවැට්ටුවා. මේ දේ මං කරන්නේ මගේ සීයා වෙනුවෙන්."තම ගිනිගන්නා දෑසින් සාෂ්කා ඔවුන් දෙස මද වේලාවක් බලා සිටියේය.

"දැන් ඔය දෙන්නා අපි එක්ක එන්න. ඔයාල එනකම් කෙනෙක් බලාගෙන ඉන්නවා." එසේ කියූ සාෂ්කා රොනල්ඩ් අත වූ ලොකරය ගෙන නැවත ආ මගින්ම රසායනාගාරයෙන් පිටතට ගියේය. ආයුධ සන්නද්ධ පිරිස මහාචාර්ය නියුමර් සහ ලුයිස් දෙදෙනාගේ අත්පා බැද දමා, ප්‍රධාන විද්‍යාඥයින් තිදෙනා රසායනාගාරය තුල තනිකරමින් මහාචාර්යවරුන්ද රැගෙන පිටතට පැමිණියහ.

"මොකක්ද ඒ වුණේ?" කිසිදු කලබලයකින්, කෑගැසීමකින් තොරව සිදුවුණු ඒ බරපතල පැහැරගැනීම අවසන් වූ සැනින් නිච්රෝල් තම කටහඬ අවදි කළේය.

"මම දන්නේ නැහැ. ඒත් මට හිතුණා මෙතන මොකක්හරි පෞද්ගලික ප්‍රශ්නයක් තියෙන බව."

"ඒත් අපිට මහාචාර්යවරුන්ව අරන්යන එක නවත්තන්න තිබුණා." ගිලේන් කීවේ තරමක් කනස්සලයකිනි.

"ඔව්, ඒත් අපිට අතිවිශාල අත්තිකාරමක් ලැබුණා. එහෙම නේද?" නිච්රෝල් කීවේය.

"මොනවා වුණත් මේක අතිවිශේෂ සොයාගැනීමක්. කාටවත් ඒක නිකන්ම විනාශ කරලා දාන්න දෙන්නත් බැහැ." ග්ලේන් කීවේය.

"අපිට මේකට පියවර ගන්න පුලුවන් තමා. ඒත් ඒක හරිම භයානක වෙන්න පුලුවන්." කැමී මිමිණුම් හඬින් කීවාය.

"අනික, ඒ පැහැරගැනීම අපි ඉස්සරහම කරන්න තරම් එයාලා නිර්භීත වුණා. එයාලා පසුපස දැවැන්ත අයෙක් සිටින බවට හොඳම සාක්ෂිය ඒක." නිච්රෝල් අදහස් දැක්වූවේය.

"ඔව්, ඔයා හරි. මේක පිටිපස්සේ ඉන්න කවුරු වුණත් එයා විශ්වාස කරලා තියෙනවා අපි මේකට කිසිම පියවරක් නොගනීවි කියලා. පැහැරගැනීමට ඔහු යොදවාගෙන තියෙන්නේත් විද්‍යාගාරයේම සහයකයන්ව. ඔහු සාමාන්‍ය කෙනෙක් වෙන්න බෑ." කැමී තවදුරටත් සිය මිමිණුම් ස්වරයෙන් පැවසුවාය.

"හොඳම දේ තමා දැන්මම අපි මේකට ක්‍රියාමාර්ගයක් නොගෙන සිටීම." නිච්රෝල් එකඟ වූවේය.

"හැබැයි, මේ ඖෂධය වෙන අයෙක් තමා නමින් ප්‍රකාශ කළත්, ඖෂධයට හා මහාචාර්යවරුන්ට මොනවාහරි වුණත් ඒ සේරටම වගකිවයුත්තන් අතර අපිත් ඉන්නවා. ඒක අපට අමතක කරන්න බැහැ." ග්ලේන් අප්‍රසන්න කටහඬකින් කීවේය.

"මේ වගේ දෙයක් වුණ පළවෙනි වතාව මේක නෙවෙයිනේ, ග්ලේන්." කැමී කීවාය. "අනික, මේ වගේ දේවල් සිද්ධවෙන අන්තිම වතාවත් මේක වෙන්නේ නැහැ."

අමරණීයයකුගේ මරණය

# Chapter 4

ලුවිස් සහ නියුමර් අත්බැද වෑන් රථයක ඔවුන් නොදන්නා පෙදෙසක් වෙත රැගෙන යමින් තිබුණි. රථයේ වීදුරුවල අලවා තිබුණු කළු පැහැ ආවරණ නිසා ඔවුන්ට පිටත පෙනුනේ ඉදිරිපස වීදුරුවෙන් පමණි. ඉදිරිපස වීදුරුවෙන් පෙණුනු මාර්ගය දෙපස ගොඩනැගිලි, ගස්වැල්, මිනිසුන් අධිවේගයෙන් පසුපසට විසිවන අයුරු ලුවිස් දුටුවේය.

"මොකක්ද මේ වුණේ?" ඔහු සිතුවේය.

රථය ඇතුලත කිසිවකු කිසිවක් කතා නොකළහ. තමාට පසෙකින් හිස් බැල්මකින් යුතුව හිද සිටින නියුමර් දෙස ඔහු බැලුවේය. තමාට අනික් පසින් ආයුධ සන්නද්ධ බටයෙකි. ඔහුගේ දෑසේ මලානික දිස්නයක් තිබුණද ඉන් එහා කිසිදු හැඟීමක් ලුවිස්ට නොපෙනුණි. සාෂ්කා රියදුරු අසුනට යාබද අසුනේ නිහඬව ගමන් කරන ආකාරයත්, පසුපස හැරුණු ඔහු රොනල්ඩ් සහ කේට් කනස්සලු සහගත පෙනුමකින් පසුපස අසුනේ ගමන් කරන ආකාරයත් පෙණුනි.

"මොකක්ද මෙකේ තේරුම?" නැවතත් ඔහුගේ සිත හඬගෑවේය.
නමුත් ඔහුට තම හඬ අවදි කරන්නට නොසිතුණි.

"ඔයාලා මගේ අසරණ සීයාව රැවැට්ටුවා. මේ දේ මං කරන්නේ මගේ සීයා වෙනුවෙන්..." විනාඩි කිහිපයකට පෙර සාෂ්කා කී දෑ ඔහුගේ හිස තුල දෝංකාර දෙන්නට විය.

"නිකොලායි පණපිටින්??" එය සිතද්දී තම සිරුරම සීතලව යන ආකාරය ඔහුට දැණුනි. "ඔහු මැරිලා නැත්නම්...!" එය සිතීම පවා ඔහුට භීතියක් දැනවිය.
"ඔහු මුණුපුරා ලවා අපෙන් පළිගන්නවා ද?"

තමා සුලු මොහොතකට පෙර කියූ නිකොලායිගේ ව්‍යාජ අතුරුදන් වීමත්, වසර කිහිපයකට පෙර එක් රාත්‍රියක ඔහුගේ අවසන් ගමන තමාත්, නියුමර්ත් එක්වී ක්‍රියාත්මක කරවූ ආකාරයත් ඔහුට සිහිවුණි.

"නිකොලායි, මේ සොයාගැනීම පිලිබඳ ගෞරවය සම්පූර්ණයෙන්ම ඔබට හිමි විය යුතුයි. එහෙම නේද නියුමර්?" රසායනාගාරය තුල තම කටහඬ ඔහුට ඇසුණි.

"ඔව්, මේ තරම් උගත් අපිටත් කරන්න බැරිවුණ දෙයක් ඔබ කළේ මිත්‍රයා." නියුමර් කීවේය.

අසූ එක් හැවිරිදි වියේ පසුවූ නිකොලායි මේ සියල්ල සතුටින් බාරගත්තේ තමා හා වසර හතලිහකට ආසන්න කාලයක් එකට සිටි සිය දෙමිතුරන් කෙරේ පූර්ණ විශ්වාසය තබාගෙනය.

"අපි මේ ජයග්‍රහණය සමරන්න ඕන." නියුමර් කීවේය.

"ඔව්,ඔව්, අපේ මිත්‍රයාට සුබපතන්න ඕන." තම කටහඩ ඔහුට ඇසුණි. තමාගේ කටහඬේ වූ ව්‍යාජ බව කෙතරම්දැයි ඔහුට සිතුණි.
නමුත් සැකකිරීමට කිසිදු කරුණක් නිකොලායි දුටුවේ නැත. එදින රාත්‍රියේ ඔවුහු සමාජ ශාලාවක පසුපස මේසයක් වටා හිඳ මධුපැන් පානයට සූදානම් වූහ.

කලින් සැලසුම් කර තිබුණු පරිදි ඔවුහු සමාජ ශාලාවෙන් පිටතට පැමිණෙන විටම පැමිණි වෑන් රථයෙන් බැසි පිරිස තුවක්කුවක් නිකොලායිගේ හිසට එල්ල කර බියවද්දා ඔහුව රථයට දා රැගෙන ගියේය. නියුමර් සහ තමා එම අවස්ථාවේදී තමාද බියපත්ව වික්ෂිප්ත වූ බව හගවමින් මනාව රංගනයේ යෙදුණු අයුරු ඔහුට සිහිවිය.
පසුදින නිකොලායිව සිරකර තබා ඇති නගරබද ප්‍රදේශයෙන් ඉවත්ව පිහිටි ජනශූන්‍ය ග්‍රාමයේ පාළු ගොඩනැගිල්ල වෙත ඔවුහු පැමිණියහ. තම මිතුරන් තමා මුදවා ගැනීමට පැමිණියේයැයි සිතා සතුටු වූ නිකොලායිගේ සතුට වැඩිකලක් නොතිබුණි.

"ලුයිස්, නියුමර් මම මෙහේ.... මාව බේරාගන්න... මේ මිනිස්සු මාව හිරකරගෙන...."

"ඔහ්, ලුවිස්, මෙන්න අපේ අසරණ මිත්‍රයා." නියුමර් ආරූඪ කරගත් ව්‍යාජ අනුකම්පා ස්වරයකින් කීවේය.

"අනේ, බලන්න මේ මිනිස්සු අපේ මිත්‍රයාව ගැටගහලා."

"ලූවිස්, නියුමර්, මට සතුටුයි ඔයාලා මාව බේරාගන්න ආ එකට." නිකොලායි සැනසුම් සුසුමක් හෙලමින් කීවේ තම මරණය සඳහා ඔවුහු පැමිණි වගක් සිහිනෙනුදු නොසිතාය.

"ඔහ්, ඇයි අපි ඔයාව බේරාගන්නේ?" තමාගේ කුරිරු කටහඩ ඔහුට ඇසුණි.

"ඔබ මැරුණාම ඔබේ සාර්ථකත්වයේ කීර්තිය? ඒක අපිට..." නියුමර්ගේ සරදම් හඩ කීවේය.

නිකොලායි සිදුවන කිසිවක් සිතාගත නොහැකිවාක් මෙන් බලා සිටියේය.
"එතකොට...ඔ, ඔයාලද මා...ව?"

"ඔව්, අපි තමා...අපි තමා ඔයාව පැහැරගත්තේ."

"තවත් කල් අරින්නේ නැතුව අපි කතාවේ මේ පරිච්ඡේදය ඉවර කරමු." එසේ කියමින් තම බඳපටියේ ගසා තිබුණු රිවෝල්වරය අතට ගන්නා තමාව ඔහුට පෙණුනි.
"මම දන්නවා මම කළේ වැරදි දෙයක් කියලා." ඔහු තමාටම කියාගත්තේය.

නිකොලායිගේ පපුවට තැබූ එක් වෙඩි උණ්ඩයකින්ම ඔහු නිසලව බිම ඇද වැටුණි. තමා සිදුකළ දෙයට දිනෙක වන්දි ගෙවීමට වෙතැයි ලුයිස්ට හෝ නියුමර්ට එවේලේ නොසිතුණි.

ඔවුහු පැමිණියේ නොදන්නා ප්‍රදේශයකටය. සුදු පැහැ බිත්ති සහිත කුඩා නිවසක් ඉදිරිපස වෑන් රථය නතරකෙරුණි. කැලෑබද ප්‍රදේශයක් වූ එහි එම නිවස හැර වෙනත් ගොඩනැගිල්ලක් පෙනෙන මානයක නොවීය. නිවස කුඩා වුණත් එය නවීන පන්නයට සාදා තිබුණි. ලූවිස් සහ නියුමර් නිවස තුලට ගෙනයනු ලැබීය. ඇතුලත හොඳින් ආලෝකවත් කරමින් විදුලි බුබුලු දැල්වෙමින් තිබුණි. නවීන වාස්තු විද්‍යාවට අනුව සකසා තිබුණු එහි වූ බුමුතුරුණු, මේස,පුටු, මේස ලාම්පු ආදී සියල්ල නැවුම් බවක් ඉසිලීය. සාලය පසුකර නිදන කාමරයක වන් දොරකින් ඇතුලුව ඔවුන්ව රැගෙන යනු ලැබුවේ අඳුරු බිම් මහලකටය. අඳුරේම ඔවුන්ව ඇදගෙන ගොස් පුටු දෙකක වාඩිකරවනු ලැබීය. කාමරයේ ඒවනවිටත් කිසිවකු සිටින බව ලූවිස්ට දැණුනේය. ඔවුන්ව ඇදගෙන එනු ලැබූ පිරිස ආපසු බිම් මහලෙන් ඉවත්ව යන හඬ ඔහුට ඇසුණි.

" හුග කාලෙකට පස්සේ.... එහෙම නේද ලූවිස්? නියුමර්?" අඳුර අතර සිටි අයෙක් ඔවුන්ව ඇමතුවේය.

"මෝල්ස්වර්ත්!!" ක්ෂණයෙන් ලූවිස්ට කියවුණි.

"ඔව්, එහෙනම් ඔයාලට තවම මාව මතකයි."

"කවුද ඔබ? ඔබ මෝල්ස්වර්ත් වෙන්න බැහැ." නියුමර් කීවේය.

"ඇයි බැරි. ඒ මම තමා."

"මෝල්ස්වර්ත් දැන් ජීවතුන් අතර නැහැ. ඉන්න විදියකුත් නැහැ." ලුයිස් පිලිතුරු දුන්නේය.

"ඔන්න එහෙනම්..." ඔහු එසේ කියත්ම කාමරයේ ඔවුන් සිටි තැනට ඉහලින් වූ විදුලි පහන දැල්වුණි.
ඔවුන්ට මුහුණලා හිද සිටි පුද්ගලයාව ඔවුන් තත්පර කිහිපයක පමාවෙන් හදුනාගත්හ. ඒ සැබැවින්ම මෝල්ස්වර්ත් බව හදුනාගත් ඔවුහු මුහුණෙන් මුහුණ බලාගත්හ.
"මෝල්ස්වර්ත්!! මේ ඔයාමද?"

"ඔව්, මේ මමම තමා."

"මේක කොහෙත්ම වෙන්න බැරි දෙයක්! අපිට ඔයාව විශ්වාස කරන්න කියලාද කියන්නේ?"

"විශ්වාස කිරීම හෝ නොකිරීම ඔයාලගේ වැඩක්...හරි, අපි තවත් කල් නොයවා අපේ වැඩේට බහිමු."

"ඇයි අපිව මෙතනට අරගෙන ආවේ? පර්යේෂණයක් පැහැරගැනීම දඩුවම් ලැබිය හැකි වරදක්."

"දඩුවම ගැන අපි පස්සේ බලාගමු. මෙ පරීක්ෂණය ඔයාලගේ නොවන බව මම දන්නවා..."

"මොකක්ද?" භීතියට පත් ලූවිස් ඇසුවාය.

"ඔව්, මේ පරීක්ෂණයේ සැබෑ අයිතිකරු, ඒවගේම ගෞරවය හිමිවිය යුත්තා නිකොලායි. මම හරි නේද?"

පිලිතුරක් ලබා දිය නොහැකි තරමටම ලූවිස් සහ නියුමර් භීතිය විසින් වෙලා ගනු ලැබ තිබුණි. "හදිසියේ ආ මේ මෝල්ස්වර්ත් කවුද? ඔහු අපේ රහස් දන්නේ කොහොමද?" ලූවිස් සිතුවේය.

"ඔයාලා දන්නවානේ සාෂ්කා කියන්නේ නිකොලායිගේ මුණුපුරා බව. තමන්ගේ සීයාගේ මිනීමැරුම ගැන කියපු සැනින් ඒ අසරණ දරුවා මේ වැඩේට කැමති වුණා. ඒවගේම ඒක අකුරටම ඉෂ්ට කළා."

මෝල්ස්වර්ත් තමාට පසුපසින් වූ මේසය මත තිබුණු යමක් අතට ගත්තේය.
"බලන්න මෙයාව මතකද කියලා." ඔහු අත්ල දිගහැර පෙන්වමින් ඇසුවේය. ඔහුගේ අත්ලේ වූයේ දිලිසෙන නිල් පැහැයකින් යුත් I2 කෘමියෙකි.
ලූවිස් හිස ඉහල පහල වැනුවේය.

"හරි, මට ඕන වුණේ කතාවට බහින්න කලින් මම මෝල්ස්වර්ත්ම බව ඔප්පු කරන්න."

ලූවිස් තමාට පසෙකින් සිටින නියුමර්ගේ ප්‍රශ්නාර්ථයක් රැඳි මුහුණ දෙස බැලුවේය.

“මට ඔයාලාව ගමනක් එක්කරගෙන යන්න තියනවා. ඊට කලින් බලන්න මෙයාවත් මතකද කියලා.”
ඔහුට පිටුපසින් අඳුර අතරින් අයෙක් මතුවිය. ඔහු දුටු ලුවිස් සහ නියුමර් භීතිය විසින් වෙළා ගනු ලැබීය.

විශ්වාස කරන්න බැහැ නේද? මම හැමදාම කියුවා වගේ මේ ලෝකේ වෙන්න බැරි දේවල් කියලා දෙයක් නැහැ. එහෙම නේද?"

“ඔ...ඔයා? න්..නික්...” නියුමර්ට කියාගත හැකිවූයේ එපමණකි. ලුවිස් භීතියෙන් ගොළුව බලා සිටියා පමණි.

“ඔව්, මම තමයි.” අමුත්තා කීවේය. “ඔයාලගේ පරණ මිත්‍රයා, නිකොලායි.”

නිකොලායි සහ මෝල්ස්වර්ත් මරණයට පත්ව නැතිද? ලුයිස් සහ නියුමර්ට පෙර ඔවුන් අමරණීය වන ඖෂධය සොයාගත්තාද? නැතිනම් මේ සියල්ල හුදෙක් මායාවක්ද? මෙයින් ඉදිරියට කුමක් සිදුවූවා විය හැකිද?

**ලෝකය පුදුමාකාරය. එහි සිදුවිය නොහැකි යමක් නොමැත. කලෙක ප්‍රබන්ධයක්, තවත් කලෙක සැබෑවක් වී මුණගැසිය හැකිය.**

**නිමි**

## ...පසුවදන...

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුලින් රටේ සාහිත්‍යය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදී.

ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැදුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුලින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි.

මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයන් සහ සැළසුම්කරුවන් මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය

දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20



“ඔබයි අප තෝරාගත් කෙනා, විශ්වයම වෙනුවෙන්. අපගේ නියෝජිතයන් ඔබට මග පෙන්නාවි. ඔබේ සාර්ථකත්වයේ එක් අදියරකදී ඔබට මා නැවත මුණගැසේවි.”

එය සිහිනයක්ම පමණක්ද? එසේත් නැතිනම්...?

"මගේ දිග කතාව මම කියන්නම්. හැබැයි ඔයාලා ඒක විශ්වාස කරයි කියලනම් මට හිතෙන්නේ නැහැ." ඩේවිඩ් මෝල්ස්වර්ත්ගේ හඩ දශක ගණනාවකට පසුවත් නියුමර්ගේත් ලුයිස්ගේත් දෙසවන් තුල දෝංකාර නංවන්නට විය.

**ලෝකය පුදුමාකාරය. එහි සිදුවිය නොහැකි යමක් නොමැත. කලෙක ප්‍රබන්ධයක්, තවත් කලෙක සැබෑවක් වී මුණගැසිය හැකිය.**

නතාරි දම්සිනි විතානාච්චි
මහ/මහාමායා බාලිකා විදුහල